# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ නවම් අමාවක පෝදා 2023 පෙබරවාරි 19 ඉරිදා BUDUSARANA SUNDAY FEBRUARY 19, 2023
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 35 පත්‍රය , ආරම්භය 1965 - 06 - 13



යටාල වෙහෙර වහන්සේ

සේයාරුව
නිශ්ශංක විජේරත්න

# පෙනෙන සතුට ළඟ නොපෙනෙන දුක

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාම විහාරස්ථානයේ වැඩ වාසය කරන කාලයෙහි රජගහ නුවර ජීවත් වූ කාන්තාවෝ හතර දෙනෙක් වෙළෙඳ ව්‍යාපාර කරමින් මුදල් උපයා ගනු ලබති.

ඔවුහු හොර තරාදි හා හොර මිනුම් ක්‍රම උපයෝගී කරගෙන අසාධාරණ ලෙස වංචා සහගතව ධන ධාන්‍යාදිය රැස් කරති. වංචාවෙන් මුදල් හම්බ කරති.

මෙසේ හොර වංචා කපටිකම්වලින් මුදල් උපයා ජීවත් වූ ඔවුහු කලෙකින් මිය පරලොව ගියහ. මරණින් පසු වෙනත් ගමක දිය අගලක් අසල ප්‍රේත අත් බැව්හි ඉපදුණහ.

මෙම ප්‍රේත ස්ත්‍රීහු රාත්‍රී කාලයෙහි තමන් පෙර ආත්මයේ කළ පව්කම් ගැන කියමින් කෑ මොර දෙන්නට වූහ. මේ භයානක ශබ්දය ඇසූ ගම්වාසීහු එක් රැස්ව සාකච්ඡා කොට අනුකම්පා උපදවා ප්‍රේත ස්ත්‍රීන්හට පින් පැමිණවීමට සිතූහ. බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නය වෙත සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට කතිකා කර ගත්හ.

ඒ සියලු විස්තර බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළහ.

භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ මහ ජනයාගේ අදහස් දැනගෙන අවස්ථානුකූලව ධර්ම දේශනා කළ සේක.


"මයං භොගේ සංහරිම්හා
සමේන විසමේනච
තේ අඤ්ඤේ පරිභුඤ්ජන්ති
මයං දුක්ඛස්ස භාගිනී"

ප්‍රේත ස්ත්‍රීහු කළ ප්‍රකාශය ඉහත ගාථාවෙන් ප්‍රකාශිත ය. අපි අසාධාරණව වස්තුව රැස් කළෙමු. අසාධාරණ ලෙස සොර සිතින් මුදල් උපයා ගතිමු. රැස් කළා වූ සම්පත් හා ධනස්ඛන්ධයක් ඉතිරි කොට අනුන්ගේම ප්‍රයෝජනය සඳහා තිබියදී අපි මිය පරලොව ගොස් ප්‍රේත ලෝකයෙහි ඉපැදුණෙමු. දැන් මහා දුක් විඳිමුයි'යන අදහසයි.

ප්‍රේත ලෝකයේ දුක්ඛිත ස්වභාවය ඉතාමත් භයානකය ය. ශෝචනීය වේ. ප්‍රේතයන්ට උස් වූ ශරීර ඇත්තේ ය. කෙසඟ ශරීර ය. දුර්වල ය. දුර්ගන්ධ ය. කෙළ සොටු සෙම කුණු ලේ මළ මුත්‍ර ආදිය ආහාරය වන්නේ ය. උගුර තෙමෙන තරමටවත් දිය පොදක් නොලබන්නේ ය. කල්ප ගණන් ප්‍රේත ලොව දුක් විඳින්නේ ය. එහෙයින් සොර සිතින් තොරව, අවංකව, අනුන්ට කරදරයක්, අසාධාරණයක් නොවන සේ උපයා ගත් ධනයම පරිහරණය ම කරන්නට කටයුතු කළ යුතු ය.

පලාවෙල රත්නපුර
ශ්‍රී ඤාණසීහ පිරිවෙනේ
**දෙව්පහළ සුමේධ හිමි**





# මිතුරු වෙසින් සිටින සතුරන් හඳුනාගන්න

බෞද්ධයාගේ ඒකායන අරමුණ නිවනයි. එය සීලයත්, කුසලයත් වැඩි දියුණු කිරීමක් මත යා යුතු ගමනක් වන හෙයින් යහපත් දිවි පැවැත්ම වඩා අත්‍යවශ්‍ය වේ.

ඛුද්දක නිකායේ ධම්මපදය තුළ ඇතුළත් 78 වැනි ගාථාවෙන් පොදු ජනයාට දෙන යහපත් සිතිවිලි සමුදායකි. එනම්, පාප මිත්‍රයන් ඇසුරු නොකරන්න. අධම මිතුරන් ඇසුරු නොකරන්න. කලණ මිතුරන්, උතුම් මිනිසුන් ආශ්‍රය කරන්න. යනුවෙන් එම ධම්මපද ගාථාව තුළින් පණිවිඩයක් දෙනු ලබයි.

**"නභජේ පාපකේ මිත්තේ
න භජේ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණේ
භජේථ පුරිසුත්තමේ.."**

යහපත් සාරධර්ම ඇති පරිපූර්ණ පුද්ගලයකු බවට පත් වීමට නම් ජීවිත පැවැත්මේ සිට සෑම ක්‍රියාවලියක් ම යහපත් විය යුතු ය. එහිදී අප ආශ්‍රය කරන පුද්ගලයන්ගේ බලපෑම අපගේ චර්යා රටාවට බෙහෙවින් බලපායි.

වර්තමාන සමාජයේ බොහෝ පුද්ගලයින් නිවැරැදි මිත්‍රයන් ලෙස ගත නො නොහැකි වුව ද සමාජයේ කොන්වීමට භාජනය නොවන ලෙස ඔවුන් අතේ දුරින් තබා ගනිමින් කටයුතු කළ යුතු වේ. තමාගේ වචනය ඔවුන් පිළිගනු ලබන්නේ නම්, ඔවුන් සුමගට ගැනීමට ධර්මාවවාදයක් දීම වැදගත් කරුණක් ලෙස බුදුදහම තුළ පෙන්වා දී ඇත.

ලොව්තුරු බුදුරජාණන් වහන්සේ මහා මංගල සූත්‍ර දේශනාවේ දී

" අසේවනාච බාලානං පණ්ඩිතානංච සේවනා..............."

පාපකාරී, බාල පුද්ගලයන් ඇසුරු නො කිරීමටත්, පණ්ඩිතයන් නැතහොත් නුවණැති පුද්ගලයන් ඇසුරු කිරීමටත් දේශනා කරන අතර, එය මංගල කාරණාවක් බවට එම සූත්‍ර දේශනාව තුළ පෙන්වා දී ඇත.

බුදුරජාණන් වහන්සේ තවදුරටත් දේශනා කරනු ලබන්නේ තමාට සමාන නැත්නම් පාප මිත්‍රයන් හා ආශ්‍රය කරනවාට වඩා තනිව හැසිරීම උතුම් බවයි.

කුක්කුට ජාතකය තුළ දී පෙන්වා දෙනු ලබන්නේ මිත්‍ර ස්වභාවයෙන් සතුරන් ද අප ඇසුරෙහි සිටින බවයි. අප මහා බෝධිසත්වයන් වහන්සේ කුකුළු යෝනියේ ඉපදුණු සමයක උකුස්සකු කුකුල් රැලේ කුකුළන් පැහැරගෙන ගොස් කෑවේ ය.එම පුවතින් ද ඒ බව පැහැදිලි කරවයි.

මෙලොව පරලොව දෙලොව දිවිමගේ යහපැවැත්ම සඳහා කලණ මිතුරු ඇසුර මහෝපකාරී වන අතර පවිටු මිතුරු ඇසුර දෙලොව ජීවිතයට ම වින කරන කටයුත්තක් වෙයි. එහෙයින් යහපත් මිතුරු ආශ්‍රය තුළින් තමන්ගේ දිවිය යහපත්ව සුපෝෂණය කර ගත යුතු ය. අප නිරතුරු ඕනෑම පින්කමක් සිදුකළ පසුව ප්‍රාර්ථනා ගාථාව හරහා පතනු ලබන්නේ ද එයම වන අතර ඒ තුළින් අපට පැහැදිලි වන්නේ යහපත් දිවියක පදනම වශයෙන් යහපත් මිතුරු ඇසුර මහෝපකාරී වන බවයි.

**" ඉමිනා පුඤ්ඤ කම්මේන
මාමේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු
යාව නිබ්බාන පත්තියා."**

යනුවෙන් සෑම පින්කමක් අවසානයේ ප්‍රාර්ථනා කිරීමට හුරු පුරුදු වී සිටින්නේ මිත්‍ර සම්පත්තිය මිනිස් ජීවිත යහමගට බෙහෙවින්ම උපකාරී වන හෙයින් බව බෞද්ධ මූලාශ්‍ර ගත කරුණුවලින් මනාව පිළිඹිබු වේ.

ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනාව තුළ පෙන්වා දෙන ආකාරයට "දහරෝවා වුද්දසීලි වුද්දෝවා වුද්ද්සීලී.." යන ගාථා පාඨය තුළින් පැහැදිලි කරන්නේ තරුණ වුව ද ශික්ෂණයකින් හා දැහැමි ගති ගුණවලින් යුතු ආශ්‍රය වැදගත් වන බවත් වයස නොව දැනුම හැදියාව ලක්ෂණ සහිත මිතුරු ආශ්‍රය සමවයසේ හෝ වැඩිහිටියකු හෝ තමන්ට වඩා වයසින් බාල කෙනෙක් ද හෝ විය හැකි ය.

එහෙයින් යහපත් චර්යාවන් හා දැහැමි ස්වභාවයන්වලින් යුතු පුද්ගල ඇසුර ඔබිනා බව පෙන්වාදී ඇත.

මීට අමතරව පන්සිය පනස් ජාතක පොතෙහි එන මනෝජ ජාතකය නරක ඇසුර නිසා එක්තරා සිංහ පෝතකයකුට අත්වන ඉරණම පිළිබඳ මැනවින් පැහැදිලි කර ඇත.

ඒ අනුව බෞද්ධ මූලාශ්‍රගත කරුණුවලට අනුව සතුරු උවදුරුවලින් තොර දැහැමි දිවියකට මග පාදා ගැනීමට සෑම විටම අප ක්‍රියා කළ යුතු අතර, බුදු දහම පෙන්වා දෙන කරුණුවලට අනුකූලව අදැහැමි පවිටු මිතුරන් හඳුනාගෙන, යහපත් දැහැමි මිතුරු ඇසුර තුළින් අප දිවි පැවැත්ම සකස් කර ගත යුතු බව මනාව අවබෝධ කරගත යුතු වේ.

නුගේගොඩ ශ්‍රී පඤ්ඤෝදය මහා පිරිවෙනෙහි
ආචාර්ය
කිරිමැටිමුල්ල ශ්‍රී වර්ධනාරාම විහාරවාසී
**ශාස්ත්‍රවේදී විල්පිට ගුණසිරි හිමි**

# සතුට සෞභාග්‍යය ලබන්න කුඩුකේඩුකම් මඟ හරින්න



ගල්වැව කනත්තේවැව
ශ්‍රී සුගතාරාම රජමහා විහාරයේ
**හිඳව සෝභිත හිමි**

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.**

**"පඤ්චහි බෝ ගහපති පුත්ත ඨානේහි සාමිකේන පච්ඡිමාදිසා භරියා පච්චුපට්ඨාතබ්බා සම්මානනාය, අවමානනාය, අනතිචරියාය ඉස්සරිය වොස්සග්ගේන අලංකාරානුප්පදානේන ති."**

පින්වතුනි,

අප මහා කාරුණික ශාන්තිනායක බුදුරජාණන් වහන්සේ තරම් මිනිසාගේ සුබසිද්ධිය, යහපත, දියුණුව හා සතුට සඳහා කථා කළ, කරුණු කියා දුන් ශාස්තෘවරයකු මුළු ලෝකයේ ම පහළ වුණේ නැහැ.

උන්වහන්සේ මිනිසාගේ ජීවිතයේ හැම පැත්තක් පිළිබඳව ම සොයා බලලයි ධර්ම දේශනා කළේ. උන්වහන්සේ කොසඹෑනුවර වැඩ සිටින සමයේ දිනක් දහවල් දානය වළඳා කොසඹෑනුවර කොහොඹ ගහක් යට විවේක සුවයෙන් වැඩ වදාරනවා.

එම නුවර එක්තරා දුප්පත් තරුණයෙක් හා තරුණියක් විවාහවීමට කතිකා කර මේ වනාන්තරය මැදින් ගමන් කරනවා. කොහොඹ රුක යට වැඩසිටින බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ඥානයට හසු වුණා මේ දෙපළ. මේ තරුණයා කතා කරනවා තම බිරිඳට ඔබටත් කිසිවෙක් නැහැ. මටත් කිසිවෙක් නැහැ යන්න එන්න තැනක් නැහැ. අර ඈත ජේන තාපසයා ළඟට ගොස් පිළිසරණක් ලබා ගමු. එහෙම කථිකා කරගෙන මේ දෙපළ ලොව්තුරා බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කොට ප්‍රකාශ කරනවා. "අප දෙදෙනා හොර රහසේ, මව්පියන්ට නොදන්වා, ඈත පිටිසර පළාතකට ගොස් අඹුසැමියන් ලෙස ජීවත් වෙන්නයි යන්නේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ දෙදෙනාට ඉහතින් සඳහන් සූත්‍රයෙන් ධර්ම දේශනා කොට වදාළා. මෙම සූත්‍රයට ජව සූත්‍රය (මළ සූත්‍රය) කියලත් ප්‍රකාශ කරනවා.

වර්තමාන සමාජයේ විවාහ ජීවිතය සම්බන්ධයෙන් විවිධ ගැටලු, විවිධ ප්‍රශ්න ඇති වෙලා තියෙන බව රහසක් නොවෙයි. ඒ නිසාම විවාහ ජීවිතය අසාර්ථක වී අසහනකාරී තත්ත්වයක් ඇති වී තිබෙන සැටිත් දකින්නට ලැබෙනවා. වර්තමාන සමාජයේ විවාහ ජීවිතය සම්බන්ධයෙන් විවිධ ගැටලු, විවිධ ප්‍රශ්න ඇතිවෙලා තියෙන බව රහසක් නොවෙයි. ඒ නිසාම විවාහ ජීවිතය අසාර්ථක වී අසහනකාරී තත්ත්වයක් ඇති වී තිබෙන සැටිත් දකින්නට ලැබෙනවා. මේ තත්ත්වය විවාහක යුවළකට මෙන්ම දරුවන්ටත් සමාජයටත් අහිතකරයි. මේ නිසා සාර්ථක විවාහ ජීවිතයක් ගොඩනඟා ගන්නට අවශ්‍ය බුදු දහමේ ඉගැන්වීම් පැහැදිලි කරලා ඒ තුළින් ඔබ මනා පැවැත්මකට යොමු කරන්නයි අපේ උත්සාහය.

පින්වතුනි, බුදුහාමුදුරුවෝ නිතරම බලාපොරොත්තු වුණේ මිනිසා සතුටින්, සුව සේ ජීවත් වෙනවා දකින්නටයි. ඒ නිසාම ජීවිතයේ හැම පැත්තක් ගැනම බුදුරජාණන් වහන්සේගේ අවධානය යොමු කළා. ජීවිතයක් සාර්ථකව සතුටින් ගෙන යන්නට අවශ්‍ය හැම කරුණක්ම පැහැදිලි කර දුන්නා. විවාහ ජීවිතය වැදගත් අවස්ථාවක් වන අතර, එය ඉතා ක්‍රමානුකූලව ගොඩනඟා ගැනීම අඹු සැමියන්ගේ විශේෂ වගකීම. ඒ වගකීම මැනවින් ඉටුවන විට ගෙදර සාමයත්, සාමකාමී සමාජ වාතාවරණයත් නිතැතින්ම ඇති වෙනවා.

සාර්ථක විවාහ ජීවිතයක් සඳහා බුදු දහමේ ඉගැන්වීම් කොතෙක් දුරට ඉවහල් වෙනවාද? සිඟාලෝවාද සූත්‍රය සාර්ථක විවාහ ජීවිතයකට ඉතාම වැදගත් උපදෙස් දෙන සූත්‍රයක්. ස්වාමියා බිරිඳට ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් තිබෙනවා. බිරිඳට ද ඇගේ ගරුත්වය රැකෙන විදියට කතා කරන්න ඕනෑ. ඇගේ සිත රිදවන්නේ නැතිව, වේදනාව ඇති නොවන විදියට කතා කරන්නත් හැසිරෙන්නත් ස්වාමියා වග බලා ගැනීම අනිවාර්යයෙන් ම සිදුවිය යුතුයි.

ස්වාමියාගේ ඉතාම වැදගත් යුතුකමක් මෙන්ම වගකීමක් තම බිරිඳ හැර වෙනත් කාන්තාවන්ගේ ඇසුර නොපැතීම. විවාහ ජීවිතය දෙදරා යන්නටත් එය ප්‍රබල හේතුවක් වෙනවා. ස්වාමියා මෙතැනදී වගකීම මනාව තේරුම් ගෙන ක්‍රියා කිරීම හරිම වැදගත් වෙනවා. ගෙදර පරිපාලනය හා මුදල් පරිපාලනය පිළිබඳ වගකීම බිරිඳට පැවරීම අතිශයින් වැදගත් වෙනවා.

මේ සඳහන් කළේ ස්වාමියා බිරිඳ කෙරෙහි දැක්විය යුතු සැලකිල්ල. සාර්ථක විවාහ ජීවිතයකට තවදුරටත් කරුණු ඉදිරිපත් කරන බුදුරජාණන් වහන්සේ කුමාරිකෝවාද සූත්‍රයේ දී පතිකුලයට යන තරුණියක තුළ තිබිය යුතු ගුණාංග පහක් දේශනා කොට වදාළා.

සැමියාට පළමුව නින්දෙන් අවදි විය යුතුයි. ඔහුට පසුව නින්දට යා යුතුයි. පසුදාට කළ යුතු වැඩ සකස් කර තැබිය යුතුයි. සැමියාගේ සිත් ගන්නා ලෙස හැසිරිය යුතු අතර, ප්‍රියමනාප වචනයෙන් කතා කළ යුතුයි.

ස්වාමියාගේ මව්පියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, පූජ්‍ය පිරිසට ගරු සත්කාර කළ යුතුයි.

ගෙදර දොරේ කටයුතුවලදීත්, සැමියාගේ කටයුතුවලදීත් දක්ෂව අනලස්ව ක්‍රියා කළ යුතුයි.

ස්වාමියාගේ මෙහෙකරුවන්ට සැලකීම. ඔවුන් නිසි කටයුතුවල පමණක් යෙදවීම. නිවසෙහි සිටින ගිලන් අයට උපස්ථාන කිරීම. අවශ්‍ය දේ සපයාදීම.

සැමියා උපයන සියලු ධන සම්පත් ආරක්ෂා කිරීම හා ඒවා අනවශ්‍ය ලෙස වියදම් නොකිරීම ද වැදගත් වෙනවා.

සාර්ථක විවාහ ජීවිතය-කට අවශ්‍ය තවත් වැදගත් කරුණු දහයක් විශාඛාවගේ විවාහයට පෙර ඇගේ පියා විසින් දෙන ලද උපදෙස් මාලාවේ සඳහන් වෙනවා. එය බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වන වැදගත් උපදෙස් මාලාවක්.

ඇතුළත ගිනි පිටතට නොදිය යුතුයි. (නිවසේ රහස් පිටතට යාමට ඉඩකඩ නොතැබීම) පිටත ගිනි ඇතුළතට නොගත යුතුයි. (පිටත තැන්වල දී ඇහෙන භේදකාරී කතා පිළිගෙන ඒ අනුව ආරාවුල් කලබල ඇති කර නොගැනීම) දෙන අයට දිය යුතුයි. (ණය දීමේදී ආපසු ගෙවන අයට පමණක් ණය දීම කළ යුතුයි.) නොදෙන අයට නොදිය යුතුයි. (ණය ආපසු නොගෙවන අයට නොදිය යුතුයි) ණය දෙන අයටත් නොදෙන අයටත් දිය යුතුයි.

අසරණ නෑදෑ හිතමිතුරන්ට ආපසු ලැබුණත් නොලැබුණත් ඒ ගැන බලාපොරොත්තු නැතුව ණය දිය යුතුයි.) සුවසේ හිඳිය යුතුයි.

වැඩිහිටියන් එන විට නැඟිටින්නට සිදු නොවන සේ කුඩා අසුනක හිඳිය යුතුයි. සුව සේ අනුභව කළ යුතුයි. නිවසේ සියලු දෙනාම ආහාර පාන ගත්තා දැයි විමසා බලා පසුව ආහාර ගැනීම. සුවසේ නිදාගත යුතු ය. (ගෙදර ගැන සැලකිල්ලෙන් නින්දට යා යුතුයි) ගිනි පිදිය යුතුයි. සැමියා ගැන සැලකිල්ලෙන් ඔහුගේ කටයුතු කිරීම ඇතුළත දෙවියන් පිදිය යුතුයි. සැමියාට, ඔහුගේ වැඩිහිටියන්ට හා පූජ්‍ය පක්ෂයට ගරු සත්කාර කිරීම.

මෙහි සඳහන් කළ උපදෙස් මාලාව සාර්ථක පවුල් ජීවිතයකට මඟ පෙන්වා ඇති, බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් වන වැදගත් උපදෙස් මාලාවකි. බිරිඳ මෙන් ම සැමියා ද සාර්ථක විවාහ ජීවිතයක් සඳහා කැපවීමෙන් ක්‍රියා කිරීම වැදගත් වෙනවා. දෙදෙනාම සාමකාමී සාර්ථක විවාහ ජීවිතයක් ගත කිරීම උදෙසා තම පෞද්ගලික අදහස්, උදහස්, රුචි අරුචිකම් සලකන්නේ නැතිව සාධාරණ ධර්මතාවක් අනුව ක්‍රියා කිරීම මෙහිදී අතිශයින් වැදගත් වෙනවා. ස්වාමි, භාර්යා යන දෙදෙනාම සම අදහස් අනුව ක්‍රියා කරනවා නම් එය තුළ ස්වභාවයෙන් ම සාමය, සතුට, සැනසිල්ල රඳා පවතිනවා. දෙදෙනාම ඔවුනොවුන් පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධයක් ඇතිව හඳුනා ගැනීමක් ඇතිව ජීවත්වීම මෙහිදී වැදගත් වෙනවා. එවිට ගැටුම්වලින් තොරව සාමකාමීව ජීවත් වෙන්න පුළුවන්. එසේ නොවූ විටයි, විවිධ ප්‍රශ්න, විවිධ ගැටලු ඇති වෙන්නේ. මේ සඳහන් කළ බුදු දහමේ ඉගැන්වීම් ඔබේ ජීවිතයට සම්බන්ධ කරගෙන ක්‍රියා කරනවා නම් සාමය, සතුට, සෞභාග්‍යය පිරි සාර්ථක විවාහ ජීවිතයක් ගත කරන්නට ඒකාන්තයෙන් ම හේතු වෙනවා.



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## නවම් අමාවක 2023-02-19

# තමන් දැවෙමින් අනුන් දැවීම

යම් පුද්ගලයකුගේ සැබෑ ස්වරූපය හඳුනාගත හැකි ඔහු දෙස බලා සිටින, ඔහු සමඟ ගනුදෙනු කරන අන්‍යයන්ට නොව ඒ පුද්ගලයාට ම ය. තමන්ගේ සිතිවිලි ක්‍රියාත්මක වන ආකාරය, තමන් ලෝකය දෙස බලන ආකාරය අන් සියල්ලන්ට ම වඩා හොඳින් අවබෝධ කර ගන්නේ තමන් ම ය.

ඒ හඳුනාගැනීම තුළ තමන්ගේ යහපත්කම, අයහපත්කම පිළිබඳ විනිශ්චයකට එළඹිය හැකි ය. ඒ විනිශ්චය අනුව ඉදිරියට තම හැසිරීම් හසුරුවා ගත යුතු ආකාරය පිළිබඳ නිවැරැදි තීරණයක් ගන්නට පුළුවන. යම් හෙයකින් අයහපත් පැවැත්මක්, අයහපත් දැක්මක්, අයහපත් ආකල්පයක් වූයේ නම් මින් ඉදිරියට එතැනින් මිදීමේ තීරණය ම අර්ථවත් ජීවිතයකට අවශ්‍ය පසුබිම ගොඩනඟනු ඇත.

ජීවන අර්බුද උග්‍රවන තරමට පීඩාකාරී වන සමාජය ඒ අසහනය පිට කරන්නේ බොහෝවිට අනුන් වෙත කෝපාග්නිය දල්වමිනි. ක්‍රෝධය මුදාහරිමිනි. මේ සිතිවිලි දැනෙන වහාම එහි භයංකරත්වය අවබෝධ කර ගන්නවා නම් තමන් දැවී, අනුන් ද දවන කෝපාග්නිය වෙනුවට මෛත්‍රියේ සිසිලස ළඟා කර ගනිමින් තමන් ද නිවී, අනුන්ට ද සිසිලසක් වන්නට පුළුවන.

ක්‍රෝධයේ විනාශකාරී බව ගැන දැනුම්වත් වන තරමට එය දුරු කර ගැනීම පහසු ය. සම්බුදු දහමට අනුව ක්‍රෝධයේ පීඩාව දැඩිව දැනෙන්නේ අනුන්ට නොව තමන්ට ම ය. ඒ ක්‍රෝධයෙන් මත් වූ පුද්ගලයාට හොඳ නරක තෝරා බේරාගත නොහැකි බැවිනි. ඒ නිසාම කයින් හා වචනයෙන් පව් සිදුකර ගනී. ඒ නිසාම ධනයෙන් ද පිරිහේ. නින්දාව, ඥාති හිතමිතුරන් දුරස්වීම පමණක් නොව පිළිසරණක් ලැබිය යුතු අවස්ථාවේ කිසිවකුගේ පිළිසරණක් නැති හුදකලා වූ අසරණයකු බවට පත්වීම ක්‍රෝධයේ ප්‍රතිවිපාක ය.

සමාජය පළමුවෙන් ම කෙනෙක් පිළිබඳ නිගමනයකට එළැඹෙන්නේ බාහිර ස්වරූපයෙනි. දුර්වර්ණ වූ අප්‍රසන්න මුහුණින් යුතු පුද්ගලයකු අප්‍රසාදය සමඟින් ප්‍රතික්ෂේප වීම සාමාන්‍ය ස්වභාවයයි. මෙම ස්වරූපයට බලපාන ප්‍රධානතම හේතුව වන්නේ සිතෙහි පවත්නා ක්‍රෝධ සහගත බවයි.

පවට ලජ්ජාවිය යුතු බව, බිය විය යුතු බව සම්බුද්ධ දේශනාවයි. ලජ්ජා බිය ඇති පුද්ගලයා වචනය සේ ම කය ද සංවර කර ගනී. ඔහු කිසිවිටෙක අශිෂ්ට වචන භාවිත නොකරයි. අසභ්‍ය, නිසරු, අනර්ථ වචන භාවිත නො කරයි. ක්‍රෝධ සිතිවිලි ඇති පුද්ගලයාට පවට ලජ්ජා බිය නැත. එහෙයින් කය හෝ වචනය සංවර කර ගැනීම පිළිබඳ නාම මාත්‍රයක හෝ හැඟීමක් ඔහුට නැත.

සම්බුදු දහමට අනුව අයහපත්, ධාර්මික ක්‍රියාවෙන් වෙන් වූ, තැවීම පිණිස වන යම් ක්‍රියාවක් වේ නම්, කිපෙන්නා එවැනි ක්‍රියාවන්හි ම නිරත වෙයි. ක්‍රෝධයේ, කෝපයේ විනාශය මෙවැනි ය. මෙලොවට පමණක් නොව මරණින් මතු ජීවිතයට ද විපත්තිකර ය.

කුඩා කල සිටම ක්‍රෝධ සිතිවිලි පාලනය කර ගන්නට, මෛත්‍රී සිතිවිලි පුරුදු පුහුණු කර ගන්නට, යහපත් ආකල්පයන්ගෙන් සිතිවිලි පෝෂණය කර ගන්නට අවශ්‍ය වටපිටාව විශේෂයෙන් වැඩිහිටියන්, ගුරුවරුන් විසින් තම දරුවන්ට, සිසු දරු දැරියන්ට සකසා දිය යුතු ම ය. නැතිනම් හෙට දවසේ අපට දකින්නට හැකි අසංවේදී, අමනුස්සකම් රජයන සමාජයකි.

පසුගිය දා තරුණ දරුවන් කිහිප දෙනෙක් එක් වී තමන්ට අවවාදයක් දුන් පියකුට ජීවිතය නැතිවන තුරු පහර දුන්නේ ඒ අමනුස්සකම් ප්‍රදර්ශනය කරමිනි. අප වහා කටයුතු කළ යුතු එවැනි අවාසනාවන්ත සිදුවීම් නැවත නොවන තැනට ය. මිනිසත් ගුණ ඇති මිනිසුන්ගෙන් මේ සමාජය පරිපූර්ණ වන තැනට ය.

# අවිද්‍යාවෙන් මඟ ඇහිරුණු සසරක ස්වභාවය

**"පුනබ්භව" නම් වූ නැවත නැවත සකස්වන "භවය" නම් වූ සංකල්පය බෞද්ධයාට බොහෝ සමීප ය. එය නැවත නැවත ඉපදීම ලෙස හුරු පුරුදු ය. පින, පව අනුව නැවත ඉපදීම සිදුවන බවත්, මෙය ම සසර ලෙසත් අපි තේරුම් ගෙන සිටිමු.**

නැවත ඉපදීමේ දී වැඩිපුරම උරුම වන්නේ දුගතියයි. මනුෂ්‍ය ජීවිතයක් ලැබූව ද ඉපදීමේ සිට ලෙඩවීම, දිරාගෙන යෑම, මරණය, ප්‍රියයන්ගෙන් හෝ ප්‍රිය වස්තුවෙන් බැහැරවීමට සිදුවීම, කැමති දෑ නො ලැබීම හෝ කැමැති ලෙසින් ඉටුනොවීම ආදී අපමණ වූ කායික සහ මානසික දුක්ඛ දෝමනස්සයන්ගෙන් පිරී පවතී. මේ මානසික දුක්ඛ දෝමනස්සයන්ගෙන් නිදහස් වීමේ හොඳම ක්‍රමය මුදල් ඉපයීම හෝ මුදල් ඉපයීමේ මාර්ගය ගොඩනඟා ගැනීම බව සමාජයේ පොදු මතයක් ව පවතී.

තවත් ආකාරයකින් පැහැදිලි කරන්නේ නම්, මේ ගෙවන ලෞකික ලෝකයට ම බැඳී හැකිතාක්දුරට ඇස, කන, නාසය, දිව, ශරීරය ආදී වූ ඉඳුරන් පිනවීම බව විශ්වාස කරති.

ඉගෙනීම, උපාධිය, රැකියාව හෝ සුදුසුකම්, තනතුරු, ගේදොර, යානවාහන, ඉඩකඩම්, විනෝදවීම්, ක්‍රීඩා ආදිය ජීවිතයේ පැවැත්ම බව බොහෝ දෙනෙක් සිතති. මේවා ජීවිතය නොවේ. ජීවිතයට මේ දේවල් එපා යැයි මෙහි දී අදහස් නොකෙරේ. ජීවිතය යනු කුමක් දැයි තේරුම් ගනිමින් මේ සියල්ල මෙහෙයවීමට උත්සාහවත් විය යුතු ය.

අප ජීවත් වන සමාජයේ වැඩි පිරිසක් පස්පව්, දස අකුසලයන්ට යොමු වී සිටින්නේ ආහාර පාන, අඳින්නට ඇඳුම් නැති නිසා ම නොවේ. ඒ වගේ ම ඉන්නට ගේ-දොරක් නැති නිසා ම නොවේ. ලෙඩක් දුකක් හැදුණුවිට බෙහෙත් හේත් නැති නිසා ම නොවේ. ජීවිතයේ යථාර්ථය, ලෝක ස්වභාවය මදක් හෝ අවබෝධ කර නො ගැනීම නිසාය. එසේ නොමැති නම් ඒ ගැන සිතන්නට තරම් ඕනෑකමක් නැති නිසා ය.

මෙයින් පැහැදිලි වන්නේ, ඔවුන් සිතන ආකාරයට ආහාර ගැනීම, නිදාගැනීම, කාමසේවනය, ඇස කන ආදී පිසිඳුරන් පිනවීම ම ජීවතය බව ය. මේවා තිරිසන් සත්වයාටත් පොදු වූ දේ ය. "ජීවිතය"හෝ "ජීවත් වෙනවා ය" යැයි සමාජ සම්මතයෙහි උගත් යැයි පවසන පිරිස් සමාජ විරෝධීව බලවත් වූ ආත්මාර්ථකාමී බවෙන් යුතුව හැසිරෙති. ආර්ය මාර්ගයට ඇතුළු වන තෙක් සෑම අයෙක් තුළ ම යම් වූ ද ප්‍රමාණයකට හෝ ආත්මාර්ථකාමී බවක් දක්නට ලැබේ. එය සමාජ සම්මතයෙහි පිහිටා ඉගෙනීම, තනතුරු ලැබීම්, ධනය ඉපයීම්, ගේ-දොර ඉදිකර ගැනීම ආදිය විය හැකි ය. ඒ අතර තවත් පිරිසක් විශාල ලෙසින් ධනය උපයා ගැනීමට සිතයි. එය සමහර විටෙක වංචනික හෝ පාපී ක්‍රියාවල යෙදීමෙන් විය හැකි ය. ඒ නිසා ම ඔවුන් සමාජයෙන් නින්දා ලබති. හිරේ විලංගුවේ වැටෙති. රණ්ඩු දබර, ගහ බැණ ගනිති, උසාවිවල නඩුවලට පැටලෙති. අවසානයේ දිවි නසා ගන්නට වුව ද පෙළඹෙති. ඒ අතෘප්තිකර ආශාවලින් ජීවිතය පවත්වා ගැනීමෙන් ජීවිතයට සිදුවන අහිතකර බලපෑම් ය.

ඒ වගේ ම තවත් සමහර කෙනෙක් වචනයෙන් වැරැදි කරති. බොරුකීම්, කේලාම්කීම්, පරුෂ වචන කීම සහ හිස් වචන පවසමින් කට නිසා පිරිහෙමින් විනාශ වෙති. ඒ වගේ ම අන් අයටත් නින්දා කරමින් බලවත් ලෙස පාපී මඟකට යොමු වී සිටිති. මේ, සිත, කය, වචනය තිදොරින් ම පව් සිදුකරමින් මෙලොවත් පරලොවත් පරිහානියට පත් කර ගන්නා වූ පුද්ගලයාගේ ජීවිත ගමන් මඟ යි.

අප සිතා සිටින සියලු සැප-දුක්, සතුට-කඳුළ, දුක්ඛ - දෝමනස්ස සමඟින් ම ජීවිතයේ සැබෑ ස්වභාවය ද පවත්වමින් ඉදිරියට ම ඇදී යයි. ඒ ලෙඩවීම, වයසට යෑම සමඟින් ම ඉන්ද්‍රියන් හි දුබලවීම සහ මරණයයි. මේවා අතර ප්‍රිය විප්පයෝගය ද බලවත් වූ ම චිත්ත පීඩා ද, සුව කළ නොහැකි මරණය පවා සිදුවන ලෙඩදුක් හට ගන්නේ නම්, ලෞකික ජීවිතයේ සියලු ම බලාපොරොත්තු ප්‍රාර්ථනා කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් යුතුව අවසන් කරන්නට සිදුවෙයි. කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් යුතුව ජීවිතයේ යථාර්ථයට මුහුණ දෙන්නටත් එය පිළිගන්නටත් සිදු වේ.

මේ සසර පැවැත්මෙහි කෙළවරක් දකින්නට නැත. ආරම්භයක් දැක ගන්නට, දැනගන්නට නොහැකි ය. අවිද්‍යාවෙන් මාර්ගය ඇහිරුණු, තෘෂ්ණාවෙන් සසරට බැඳුණු, දිවෙන සැරිසරන සත්වයන්ගේ ස්වභාවය මේ යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළහ.

මෙසේ බොහෝ මිනිසුන් දැන හෝ, නො දැන හෝ දුක්විඳිමින් සිට මිය පරලොව යති. බුදු දහමට අනුව මරණින් මතු දුගතියක උපදින්නේ නොදන්නාකම සහ අනුවණකම නිසා ය. "මගේ, මගේ" යැයි සිතමින්, පවසමින් සිතින් මෙන් ම අතින් අල්ලාගත් දෙය ද, ලියා තැබූ දෙය ද, ආරක්ෂිත තැනක තබා වැසූ දෙය ද, බැංකුවක තැන්පත් කළ දෙය ද මෙලොව තබා මොහොතකින් මිය යන්නට පුළුවන. මෙලොව සියලු සම්බන්ධකම් සැණින් නිමා විය හැකි ය.

මගේ යනුවෙන් ඇති කර ගත් බැඳීම ම තෘෂ්ණාව ය. එම තෘෂ්ණාව බලවත් වූයේ නම් නරක, තිරිසන්, ප්‍රේත, අසුර නම් වූ සතර අපායේ උපතක් ලබා දෙන්නේ ය. තෘෂ්ණාව බලවත් වූයේ ප්‍රාණඝාත සොරකම, කාම මිත්‍යාචාරය, බොරුව, මත්වතුරෙන් ඇති කර ගත් කෙලෙස් මදය සහ අකුසලයට නැඹුරු වන ප්‍රමාදය වැනි පාප නිසා නම්, සතර අපාය නම් වූ දුගතියෙහි ගත කරන කාලය බොහෝ වන්නේ ය.

"වෙනස්වීම" එනම් සියල්ලෙහි ඇති "අනිච්ච" බව අමතක කොට අතෘප්තිකර ආශාවන්ගෙන් යුතුව ජීවිතය විඳින්නට යෑමෙන් අවසානයේ හිමි වන්නේ මේ ජීවිතයත්, මරණින් මතු ජීවිතයත් විඳවීම ය.

මේ සසර දුක නැසීම හෙවත් සසර කෙටිකර ගැනීම යනු කුමක් දැයි තේරුම් කොට ගත යුත්තේ, මනුෂ්‍යත්වය හෙවත් මිනිසත් බව යනු කුමක් දැයි හැකිතාක් දුරට නිවැරැදිව තේරුම් ගැනීමෙනි. මනුෂ්‍යයකු වී ඉපදීම දුර්ලභ බව ඉතා හොඳින් අවබෝධ කර ගත යුතු ය. එම දුර්ලභව ලැබූ මනුෂ්‍ය ජීවිතය ද ඉතා ම කෙටි බවත්, ඕනෑ ම මොහොතක මේ ජීවිතය අත් හැරෙන බවත් තේරුම් ගත යුතු ය.

තථාගත බුදුරජාණන් වහන්සේ දේශනා කළ උතුම් වූ දහම එයයි. බෞද්ධයන් ලෙස අප ඒ සත්‍ය තේරුම් ගෙන ජීවිතය හසුරුවා ගන්නේ නම්, මෙලොව සේ ම පරලොව ජීවිතය ද සාර්ථක කර ගන්නට හැකි වනු ඇත.



දීපා පෙරේරා

# ත්‍රිපිටකය ඉගෙනගත් පමණින් මහණකම සම්පූර්ණ වෙන්නේ නෑ

**මේ කතා පුවත සිදු වෙලා තියෙන්නේ සද්ධාතිස්ස මහරජතුමාගේ රාජ්‍ය සමයේ. මේ කාලයේ අනුරාධපුරයේ ජීවත් වෙලා තියනවා අමාත්‍ය කුලවලට අයත් බොහෝ පිරිසක්.**

එක් අමාත්‍ය පවුලකට උපදිනවා රූපයෙන්, නුවණින් පොහොසත් පුතෙක්. ඔවුන් ජීවත් වුණු ගම අයත් වෙලා තියෙන්නේ දක්ඛිණගිරි විහාරය පිහිටි ප්‍රදේශයට යි.

පුතාගේ මවත්, පියාත් බුදුන් වහන්සේටත්, ධර්මයටත්, සංඝයාටත් ගෞරව දක්වන ශ්‍රද්ධා සම්පන්නව ජීවත් වන දෙන්නෙක්. ඔවුන්ගේ පුරුද්දක් තිබුණා දිනපතා විහාරයට ගොඩවෙලා ධර්මය අහන්න.

පුංචි පුතාත් ටිකෙන් ටික ලොකු වුණා. බුදු බණ පද එකින් එක ඉගෙන ගත්තා. දැනුම් තේරුම් වයසට පත් වුණ ගමන් දෙමාපියන් අමතලා

“මෑණියනි, පියාණෙනි, මට පැවිදි වෙන්න අවසර දෙන්න; මට බුදු බණ ඉගෙන ගන්න ඕනෑ"යි පවසා සිටිනවා. මව්පිය දෙදෙනාත් විහාරයට ගිහින් මහතෙරුන් වහන්සේලාට නමස්කාර කරලා දරුවාගේ කැමැත්ත දන්වා සිටියා.

පුංචි වයසක සිටියත් හොඳ බුද්ධියක් පිහිටි නිසා වහා ධර්මය අවබෝධ කර ගනීවි”යි තෙරුන් වහන්සේ කල්පනා කරලා සුබ මොහොතක් බලා කාලබුද්ධරක්ඛිත නමින් පැවිදි බිමටත් පත් කළා.

බුදු දහම ග්‍රන්ථ ධුරය හා විදර්ශනා ධුරය යනුවෙන් ධුර දෙකකින් යුක්තයි. තරුණ වයසක දී පැවිදි බිමට පත් වුවහොත් ග්‍රන්ථ ධුරය පුරන්න ඕනෑ. මෙහි දී සිදු වන්නේ ත්‍රිපිටකය හොඳින් ප්‍රගුණ කිරීමයි. පුංචි සාමණේරයන් වහන්සේටත් ත්‍රිපිටක දැනුම ලබා දීමට උපාධ්‍යායන් වහන්සේ තීරණය කළා. සෑගිරියේ වැඩ සිටි ප්‍රවීණ තෙරුන් වහන්සේ වෙත යොමු කළා ඉගෙනීම් කටයුතුවලට. වසර කිසිපයක් ගතවන්නටත් පෙර ත්‍රිපිටකය ම හොඳින් ඉගෙන ගත්තා. ඕනෑම ධර්ම කරුණක් පැහැදිලි කරදීමට කාලබුද්ධ රක්ඛිත හිමියන්ට දැන් හැකියාව තිබෙනවා.

විහාරයේ සිටි සෙසු භික්ෂූන් වහන්සේත්, දායක පිරිසත් පුදුමයට පත් වුණා. දවසක් තමන් ත්‍රිපිටකය ඉගෙන ගෙන අවසන් බව කියන්න ලොකු හාමුදුරුවන් වහන්සේ හමුවන්න පැවිදි වූ විහාරයට වැඩම කළා. ගුරු හිමියන්ගේ පාද මත නළල තබා නමස්කාර කර “ස්වාමිනි, ගුරු දේවයන් වහන්ස, මම සමස්ත ත්‍රිපිටකය ම ඉගෙනගෙන අවසන් කළා”යි දන්වා සිටියා.

එහෙත් උන්වහන්සේ සිනාසීමක් හෝ කථා කිරීමක්වත් කළේ නෑ. ආසනයෙන් නැගිට එතැනින් නික්මුණා. දෙවැනි දවසෙත් ගුරු හිමියන් නිදහසේ වැඩ සිටින අවස්ථාවක් බලා නැවතත් එලෙසම නමස්කාර කර

“ස්වාමිනි, මම ත්‍රිපිටකය ම ඉගෙනගෙන අවසන් කළා. මට ආශිර්වාද කරන්න. සතුටට පත් වෙන්න"යි කියා සිටියා. එහෙත් සිනාසීමක් හෝ කථා කිරීමක් හෝ සිදු කළේ නෑ. කාලබුද්ධ රක්ඛිත හිමියන් බොහෝම දුකට පත් වී

“ස්වාමිනි, මගේ කවර හෝ දෝෂයක් තිබේදැ”යි විමසා සිටියා.

එවිට උපාධ්‍යයන් වහන්සේ ඔහු අමතා “ආයුෂ්මත් බුද්ධරක්ඛිත, ඔබ තුන්පිටකය ම හොඳින් ප්‍රගුණ කළ බව, ඉගෙන ගත් බව මට පැවසුවා. ඔබ හිතනවා ද දැන් මහණකම සම්පූර්ණයි කියා. ත්‍රිපිටකය ඉගෙනගත් පමණින් මහණකම සම්පූර්ණ වෙන්නේ නෑ.” යි කියා දන්වා සිටියා.

එය අසා සිටි කාල බුද්ධරක්ඛිත හිමි “ස්වාමිනි, ශ්‍රමණ ධර්මය සම්පූර්ණ කරන්න මම මොකක්ද කරන්න ඕන?” යි විමසුවා.

“ඔබ පිරිවරාගෙන සිටින දායකයනුත්, ශිෂ්‍ය පිරිසත් අතහැරලා වාත කසින පර්වතයට වැඩම කරලා මහණකම සම්පූර්ණ කර ගන්න”

අවවාද කළා. ගුරු හිමියන්ගේ අවවාද පිළිගෙන උන්වහන්සේට නමස්කාර කර අදාළ පර්වතයට වැඩම කර භාවනා කරන්න පටන් ගත්තා. නොබෝ දවසකින් ම සිවුපිළිසිඹියාපත් මහ රහත් බවට පැමිණ ගුරුහිමියන්ට ඒ බව දන්වා සෑගිරියට වැඩම කර ධර්මය කියා දෙමින් වැඩ සිටියා.

කාලබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේගේ කීර්තිය හෙළදිව පුරා පැතිර යන්න පටන් ගත්තා. එකල රාජ්‍ය කළ සද්ධාතිස්ස රජතුමාටත් අහන්න ලැබුණා කාලබුද්ධරක්ඛිත තෙරුන් වහන්සේගේ ධර්ම ඥානය හා අර්හත්වීමේ පුවත.

සෑගිරියේ උපසම්පදා විනය කර්ම සිදු කරන සමයක් උදාවුණා. රජතුමාත් සෑගිරියට පැමිණ මහතෙරුන් වහන්සේ හමුවී අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් තමන්ට සකසා දුන් ගල් ලෙනක කාලය ගත කරමින් සිටියා. එකල එක් ඇමතියකු අමතා, කාලබුද්ධ රක්ඛිත තෙරුන් වහන්සේට උපස්ථාන කරන භික්ෂුව තමන්ට මුණ ගැසීමට අවස්ථාව සලසා දෙන ලෙස දන්වා සිටියා.

තෙරුන් වහන්සේගේ උපස්ථායක භික්ෂුව රජු වෙත වැඩම කර වූ පසු රජතුමා උන්වහන්සේ අමතා

“ස්වාමිනි, කාලබුද්ධ රක්ඛිත තෙරුන් වහන්සේ ධර්ම ගැටලු විසඳන මොහොතක් හෝ ධර්ම දේශනා කරන මොහොතක් හෝ යෙදුණ වහාම මා දැනුවත් කරන්න”යි දන්වා සිටියා.

පසුදින උපසම්පදා කටයුතු අවසන් වී සියලු දෙනා වහන්සේ ම කණ්ඨක චේතිය වන්දනා කරන්න වැඩම කළා. ආපසු විහාරයට වැඩම කරන අතරතුර එක් භික්ෂුවක් කාලකාරාම සූත්‍රයෙන් එක් ප්‍රශ්නයක් විමසුවා. එවිට කාලබුද්ධ රක්ඛිත තෙරුන් වහන්සේ “ආයුෂ්මතුනි, අද ධර්ම ගැටලු විසඳන දවස නොවේ, බණ කියන දවසයි. එසේ වුවත් කමක් නෑ. මේ ගස සමීපයේ දී ම ධර්මය දේශනා කරමි. මට ආසනයක් ගෙන එන්න”යි ආසන පනවා කාලකාරාම සූත්‍රයෙන් ම ධර්ම දේශනා කරන්න පටන් ගත්තා.

උපස්ථායක භික්ෂූන් වහන්සේ රජතුමාට ඒ බව දැන්නුවා. තුන්යම් රාත්‍රියම ත්‍රිපිටකයේ විවිධ තැන්වලින් බුදුගුණ දක්වමින් ධර්මය දේශනා කළා. රජතුමාත් අප්‍රසිද්ධ වෙසින් ආරම්භක ගාථා අවසන් වීමටත් පෙරම පිරිස් කෙළවර හිඳගෙන ධර්මය ශ්‍රවණය කරන්න පටන් ගත්තා.

අලුයම් කාලයේ “ඉදමවෝච භාගව“යි කියමින් ධර්ම දේශනාව අවසන් කළා. එවිට හැමෝම පටන් ගත්තා සාධුකාර දෙන්න. රජතුමාගේ සාධු නාදය තෙරුන් වහන්සේට අසන්න ලැබී “රජතුමනි, ඔබ කොයි අවස්ථාවේ ද පැමිණියේ?”යි විමසා සිටියා. “ස්වාමිනි, ආරම්භක ගාථාව අවසන්වීමට පෙරම මම ධර්ම ශ්‍රවණයට ඉඳ ගත්තා” යි පිළිතුරු දුන්නා.

“මහරජතුමනි, ඔබ කළේ අමාරුම කාර්යයක්, අපහසුවෙන් සිටියේද?යි නැවතත් විමසුවා.”

නැත ස්වාමිනි, ආරම්භයේ පටන් අවසානය දක්වාම බුදු බණ පදයක් නෑර හොඳින් අවබෝධ කර ගත්තා. එක් බණ පදයක්වත් අමතක වූයේ නම් මාගේ රාජ අණසක කෙවිටක් දුරටවත් පවතින්නේ නෑ”යි දිවුරා දන්වා සිටියා. රජතුමා උගත් බුදුගුණ ඇසුරින්ම “ස්වාමීනි, බුදුගුණ පවතින්නේ මෙපමණද?”යි ප්‍රශ්න කළා. එයට පිළිතුරු දෙමින්

“මහරජ, මා දේශනා කළේ ඉතාම ටිකයි. බුදුගුණ නම් අනන්තයි, අප්‍රමාණයි, කියා නිම කරන්න බෑ” යි පැවසුවා.

ඒ අසා සිටි රජතුමා “ස්වාමිනි, මට එය උපමාවකින් පහදා දෙන්න”යි ඉල්ලා සිටියා.

තෙරුන් වහන්සේ රජතුමාගේ ආරාධනාව පිළිගෙන “ මහ රජතුමනි, ඔබ වගා කරවන අමුණු දහස් ගණනකින් එක් හැල් කෙතක එක් හැල් කරලක් වගේ’යි මම දේශනා කළ බුදුගුණ, දේශනා නොකළ බුදුගුණ ඒ කරල හැරුණම ඉතිරි හැල් වී කරල් වගේ” යි පහදා දුන්නා.

දෙවැනියටත්, තෙවැනියටත් උපමා දක්වමින් පහදන්නයි ආරාධනා කළා.


ඒ දෙවතාවේ දී මහසැඩ පහරින් ගලන ගංගාවක ජලයෙන් ස්වල්පයක් ඉදිකටු සිදුරකින් ගන්නේ ද? ඉතිරි ජලය බොහෝ වේ ද? එපරිද්දෙනුත්, වැහිලිහිණියකු අහසේ පියාඹන්නේ ස්වල්ප දුරක් ය. සෙසු ආකාශය බොහෝ වන්නේ ය. එපරිද්දෙනුත් මා දේශනා කළ බුදු ගුණ ඉතා ස්වල්පයයි. දේශනා නො කළ බුදුගුණ විශාලයි පවසමින් උපමාවලින් බුදුගුණ පහදා දුන්නා.

රජතුමා මහත් සතුටට පත් වෙලා “ස්වාමිනි, ඔබ වහන්සේගේ ධර්ම දේශනාවට සුදුසු පූජාවක් කරන්න තරම් මම පොහොසත් නෑ. දිළිදු පූජාවක් කරන්නම්. මේ සියක් යොදුන් රාජ්‍ය ඔබ වහන්සේට පූජා කරනවා”යි තෙවතාවක් ම උන්වහන්සේට නමස්කාර කර ලංකාද්වීපය ධර්ම පූජාවක් සේ පූජා කළා.

රජතුමාගේ ශ්‍රද්ධාව හා සතුට වෙනුවෙන් පූජාව ඉවසා වදාරා “මහරජතුමනි, ධර්ම පූජාවක් සේ පූජා කළ රාජ්‍ය නැවතත් ඔබට බාර කරමි. රජතුමනි, ඔබගේ ශ්‍රද්ධාවට, බුද්ධ භක්තියට සමාන කිරීමට සමත් උපාසකයෙක් මිහිපිට නෑ. දැහැමෙන් සෙමෙන් රාජ්‍ය පාලනය කරන්න”යි ආශීර්වාද කළා. මේ කතා පුවත මජ්ඣිම නිකාය අටුවාවේ සච්චක සූත්‍ර දේශනාවේ සඳහන් වෙනවා.

භික්ෂුවකගේ ජීවිතය සම්පූර්ණ වන්නේ ත්‍රිපිටකය ඉගෙන ගැනීමෙන් පමණක් නොවන බවත්, සද්ධා තිස්ස රජතුමා සම්බුද්ධ ශාසනයට දැක්වූ අප්‍රමාණ ශ්‍රද්ධාවත් මේ කතා පුවතින් පහදා දෙනවා.

ධර්මය දැන ගන්නවා වගේ ම එය ප්‍රායෝගික කළ යුතු බව කාලබුද්ධ රක්ඛිත රහතුන් වහන්සේගේ චරිතයෙනුත්, සද්ධාතිස්ස රාජ චරිතයෙනුත් තවදුරටත් පෙන්වා දෙනවා.



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

# පරලොව ගිය අයට දිය හැකි අග්‍රතම තිළිණය



**යම් කෙනකුට පිරිනැමිය හැකි මහඟු තිළිණය ලෙස බුදුරජාණන් වහන්සේ වදරා ඇත්තේ මිය ගිය ඥාතීන් වෙනුවෙන් පින්දහම් කිරීම හා එම පින අනුමෝදන් කරවීමයි. තවද පින් අනුමෝදන් කරන්නා එ මඟින් තවත් පිනක් රැස් කර ගන්නා බව ද උන්වහන්සේ වදාළ සේක.**

කුසල් කිරීමේ යෙදුණු, විශේෂයෙන් ම ‘මහණ බමුණන්ට දන්දීමේ යෙදුණු අයට එම කුසල් තම මිය පරලොව ගිය ඥාතීන්ට අනුමෝදන් කරන ලෙස බුදුරදුන් ඔවුනට උපදෙස් දී ඇත. දන්දීමේ දී මියගිය ඥාතීන් වෙනුවෙන් දන් දීමට ද, දන් දෙනවිට මෙසේ සිහිපත් කරන ලෙස ද උන්වහන්සේ උනන්දු කළ සේක.

එනම් ඔහු ජීවත්ව සිටිය දී ඔහු මෙවන් සම්පත් මට දී ඇත. ඔහු මේ දේ මා වෙනුවෙන් කර ඇත. ඔහු මගේ අසවල් ඥාතියා ය. මගේ හවුල්කරු ය යනාදි වශයෙනි.

(තිරෝකුඩ්ඩ සූත්‍රය ඛුද්දකපාඨ)

ඇඬීමෙන් පලක් නැත. දොම්නස් වැළපීම්, ළාතෝනි දීම්වලින් මළගියවුනට කිසිදු යහපතක් නො වන්නේ ය. මළගිය ඥාතීන් වෙනුවෙන් පින් අනුමෝදන් කරවීමේ පොදු විශ්වාසය පදනම් වී ඇත්තේ කෙනකු මිය ගිය විට ඔහුගේ පින් පව් එකිනෙක ගෙන තුලනය කිරීමෙන් ඔහුගේ ඉරණම තීරණය කිරීම ගැන ය.

ඔහුගේ ක්‍රියා කලාපය ඔහු යහපත් ස්ථානයක ප්‍රතිසන්ධිය ලබා ගනී ද, අයහපත් රාජධානියකට වැටේ ද යන්න තීරණය කරත්ම මිය ගිය අයගේ ආත්මය අනික් මිය ගිය අයගේ ආත්ම ඇති ලෝකයකට ගමන් කරන බව සමහර අයගේ විශ්වාසයකි.

පහත් ලෝකවල උපදින අයට අලුතෙන් පින් රැස් කර ගැනීමට නො හැකි ය. මෙලොව දී උපයා ගත් පින් මහිමයෙන් එහි ජීවත් විය යුතු ය. අනුනට හානි නො කර ජීවිත කාලය තුළ දී කුසල් රැස් කර ගත් අය නිරායාසයෙන් පහසු ස්ථානයන්හි උපත ලබන්නට වාසනාව ලබති. එවැනි අයට ජීවත්ව සිටින ඥාතීන්ගේ ආධාරය අනවශ්‍ය යි. කෙසේ වෙතත් සුවදායක ස්ථානයන්හි ඉපදීමට තරම් අවස්ථා නැති අය ජීවත්ව සිටින ඥාතීන් ගේ පින් ලබා ගැනීමට අපේක්ෂාවෙන් සිටින්නේ තමන්ගේ ඌණතාව සපුරාගෙන සතුටුදායක වාසස්ථානයක ඉපදීමට හැකිවීම සඳහා ය.

අවාසනාවත් ආත්මභාවයන්හි පුනරුත්පත්තිය ලැබූවන් ඔවුන්ගේ වේදනාකාරී තත්ත්වයන්ගෙන් මුදවාගත හැක්කේ තම මිතුරන්, ඥාතීන් කරන්නා වූ කුසල කර්මයන්ගේ පින පවරා දීමෙන් හෙවත් අනුමෝදන් කිරීමෙනි.

මිය ගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමේ බෞද්ධ මතය පැරැණි යුග සිසාරා පැමිණි හින්දු සමයේ චාරිත්‍රයක අනුරූපයකි.

මියගිය ඥාතීන්ගේ ආත්මයට සාමයෙන් ජීවත්වීමට විවිධ උත්සව පවත්වමින් ආධාර කරති. මේ චාරිත්‍රය ඇතැම් බෞද්ධ රටවල සමාජ ජීවිතයේ මහත් බලපෑමක් කෙරෙයි. කිසියම් යහපත් වැඩක් කළ කල්හි මියගිය අය සිහි කරති. බොහෝ විට එය කරනු ලබන්නේ ඔවුන්ගේ ජීවිත හා සම්බන්ධ අවස්ථාවල දී ය. එනම් උපන් දිනය හෝ අභාවය ස්මරණය කරන සංවත්සරවල දී ය. එවැනි අවස්ථාවල සාමාන්‍යයෙන් පවත්වනු ලබන පුද පූජා ද වෙයි.

පවරන්නා හෙවත් අනුමෝදකයා යම් භාජනයකින් ජලය ගෙන වෙනත් භාජනයකට වත් කරමින් පාලි ගාථාවන් කියයි. එහි අන්තර්ගත අදහස මෙසේ ය.

යම් සේ ගංගාවන් පිරී ගිය කල
වහා ගලා ගොස් මහ සමුදුරට වදී ද,
එසේ ම මෙතැ නින් වෑහෙන ජලය ගලා යන
සේ එහි සිටින මියගියඅයට එළදායී වේවා
උස් තැනින් වැගිරෑ මේ ජලය
පහළට වැගිරී යන සේ මේ දුන් පින
එහි සිටින ජීවීන්ට අත්වේවා

නිධිකණ්ඩ සූත්‍රය - ඛුද්දක පාඨ

පින් අනුමෝදන් කිරීමේ මූලාරම්භය හා වැදගත්කම ශාස්ත්‍රීය විවාදයකට විවෘත වූවකි. මෙකී පැරැණි සිරිත අද දක්වා බොහෝ බෞද්ධ රටවල පවතින නමුදු මෙය අනුගමනය කරන බෞද්ධයන් අතුරෙන් මෙම පුණ්‍යානුමෝදනාවේ අර්ථය හා යෝග්‍ය ක්‍රියා පිළිවෙළ අවබෝධ කර ගෙන ඇත්තේ ඉතා ටික දෙනෙකි.

සමහරු නිකරුණේ කාලය හා ධනය මිය ගිය අය සිහි කිරීමේ උත්සව සහ පරිසාධනයන් සඳහා නාස්ති කෙරෙති. මේ පුද්ගලයෝ අධික වියදමින් භූමදානාගාර, සොහොන් කොත්, තොරණ හා වෙනත් ආම්පන්න ගොඩනැඟීමෙන් මිය ගියවුනට සෙතක් සැලසිය නොහැකි බැව් වටහාගෙන නොමැත.

හඳුන්කූරු, කඩදාසි දැල්වීමෙන් පරලොව ගිය අයට ආධාර දිය හැකිද? නැතහොත් සත්ව ඝාතනය කරමින් සතුන් බිලි පූජාවලට යොදා ගනිමින් ආහාරපානාදිය දීමෙන් මිය ගිය ඇත්තනට පිළිසරණ විය හැකි ද? තවද දුප්පතුනට දිය හැකි මියගිය ඇත්තන් පරිහරණය කළ දෑ ගිනි දෙවියනට පුද කිරීමෙන් මියගිය අයට සැලසෙන සෙතක් නැත. එය නාස්ති කිරීමක් පමණි.

මිය ගිය අයට උදව් විය හැකි එකම ක්‍රමය නම් ඔවුන් සිහිකර ආගමානුකූල ක්‍රමයකට කිසියම් කුසල ක්‍රියාවක යෙදීම ය. එකී පුණ්‍ය ක්‍රියාවකට දන්දීම, පාසල් ගොඩනැඟිලි ඉදිකිරීම, විහාරස්ථාන, අනාථ නිවාස, පුස්තකාල ආරෝග්‍යශාලා දහම් පොත්පත් බෙදාදීම වැනි කටයුතු ඇතුළත් විය හැකි ය.

බුදුරදුන්ගේ අනුගාමිකයන් නැණවත් ලෙස කටයුතු කළ යුතු ය. කිසිවකු අන්ධානුකරණය නො කළ යුතු ය. වෙනත් අය මිය ගියවුන් වෙනුවෙන් යාඥා පවත්වන අතර බෞද්ධයෝ ඔවුන්ගේ මෛත්‍රී සහගත චෛතසික තරංග මිය ගිය අය වෙත පතුරුවති. පුණ්‍ය ක්‍රියාවල යෙදෙමින් එම පින් මිය පරලොව ගියවුන්ගේ සුබ සාධනය සඳහා අනුමෝදන් කෙරෙති.

මියගිය අයගේ නම පැවතීමටත්, ඔවුනට සැබෑ අන්දමින් හරසර දැක්වීමටත් හොඳම ක්‍රමය එයයි. ඔවුන් සුවපත් වූ විට මිය ගිය ඇත්තන්ට ද ඔවුන්ගේ ජීවමාන ඥාති මිත්‍රාදීනට ද, ඒ අයගේ ආශීර්වාදය ද, අන්‍යෝන්‍ය කරණය ද සිදුවිය හැකි ය.

එබැවින් ජීවතුන් අතර සිටින ඥාතීන්ගේ යුතුකම වන්නේ පින් අනුමෝදන් කරවීමෙන් හා ඍජුව ම මෛත්‍රිය පැතිරවීමෙන් තම මිය පරලොව ගිය අය සිහිපත් කිරීම ය.

**කේ.ශ්‍රී ධම්මානන්ද හිමි**

# ජය පරාජය උරුම වන හැටි

ඇඟේපතේ සවිය සැමදා එකසේ නො පවතී. හද්‍ර යෞවනයේ දී ගත රැඳි බාහු බලය කෙමෙන් කෙමෙන් වියැකී යන්නේ හිරු අවරට යන්නා සේ ය.

ලෙඩ රෝග, විපත්තීන් අප කරා පැමිණෙන්නේ අනාරාධිතව ය. අප දැනුවත් කිරීමකින් තොරව ය. මේවා මනුෂ්‍ය ජීවිතයක නෛසර්ගික ලක්ෂණ ය. එහෙත් ලෙඩ දුක් ව්‍යාධීන් හා අනපේක්ෂිතව කඩා වැටෙන විපත්තීන් හමුවේ අතමිට හිඟ නොවන විට එහි බරපතලකම සමනය කර ගැනීමට ද පුළුවන. එවන් ආපත්තියක දී උපයා සපයාගත් දෙයක් නොමැති කල එයින් බොහෝ පීඩාවට පත්වේ.

හොඳින් සෙවිලි කළ නිවෙස අව්වෙන්, වැස්සෙන්, පින්නෙන් ආරක්ෂිත ය. එපරිද්දෙන් අපේ මනුෂ්‍ය ජීවිතය ද හොඳින් සැලසුම් කොට හෙළි පෙහෙළි කරගෙන ආරක්ෂා කර ගත යුතු ය.



බෝසතාණන් වහන්සේ මෙලොව ජනිත වීමට පෙරාතුව තුසිත දෙව්ලොව සිට පස්මහ බැලුම් බැලූහ. පස් මහ බැලුම් නම් කාලය, දීපය, දේශය, කුලය, මව යන කරුණු පහයි. නුසුදුසු කල නුසුදුසු පෙදෙසෙක ඉපදුණහොත් තම අභිමතාර්ථයන් ඉෂ්ට සිද්ධ කර ගත නොහැකි ය. එහෙයින් සමාජ ශෝධනයක මුල් ගමන්කරුවා වන්නට, පටු බෙදීම් මනුෂ්‍යත්වයට නිගාවක් බව ලොවට කියා දෙන්නට ඉහත පෙන් වූ පරිදි උසස් කුලයක ගුණ දහමින් අනූන මාපිය යුවලකට දාව උපත ලබන්නට උන්වහන්සේ පස්මහ බැලුම් බැලූහ.

මෙවැනි සිද්ධීන් තුළින් අපට ගත හැකි පාඩම් බොහෝ ය. යමක් කරන්නට පෙර හොඳින් සිතා බලා හරියාකාරව කිරීමට පුරුදු පුහුණුවීම දෙලොව අභිවෘද්ධියට ම හේතු වෙයි.

එහෙයින් ම ඇඟේපතේ සවිබල ඇති කල එයින් නියම එල ප්‍රයෝජන ලබා ගත යුතු ය. අව්ව තියෙද්දී සේදූ රෙදි පිළි වියළාගත හැකි සේ ය.

සකල සත්වග කෙරේ පතළ පුත්‍ර ස්නේහයෙන් තථාගතයන් වහන්සේ වදාළ මේ උතුම් සදුපදේශයන් දිවි මඟට බද්ධ කරගත් නුවණැතියෝ ම දෙලොව ජය ගනිති, දිනති. එවන් මහර්ෂ උපදෙස් බැහැරලුවෝ දුකේම ගැලෙති.
ඔවුනට මෙලොව ද දුකකි.
පරලොව ද දුකකි.

**ශාස්ත්‍රපති**
**රාස්සගල චන්දකිත්ති හිමි**

# සැබෑ සතුට

# සොයා ගත හැකිද?

**මේ ලෝකයේ ජීවත් වන විට, අපගේ මූලික සැලකිල්ල යොමු වන්නේ අපගේ පැවැත්මටයි. එනම්, ආහාර සහ ඇඳුම් පැළඳුම් වැනි ජීවත් වීමේ මූලික අවශ්‍යතාවලටයි.**

මෙය ද්‍රව්‍යමය තත්ත්වයන් මත පදනම්ව වුණු සාපේක්ෂව සරල අවශ්‍යතා සපුරා ගත් පසු, අපි සැබෑ සතුට සෙවීමට යොමු වෙමු. එය සෑම කෙනෙකුම සැලකිලිමත් වන, සහ උත්සාහ කරන දෙයකි.

ඉතින්, සතුට යනු කුමක්ද? එය භෞතික හෝ ආධ්‍යාත්මික ද?

සතුට තනිකරම පදාර්ථය මත රඳා පවතී නම් එහි ප්‍රමාණය ගණනය කළ හැක. අපිට ඒ සඳහා යම් මුදල් ප්‍රමාණයක් හෝ කොන්දේසි කිහිපයක් වශයෙන් සම්මත දර්ශකයක් සකස් කළ හැක. කෙසේ වෙතත්, යථාර්ථයේ දී එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

දුප්පත් වූ විට බොහෝ මිනිසුන් තම භෞතික තත්ත්වයන් වැඩිදියුණු කිරීම මත සතුට සඳහා ඔවුන්ගේ බලාපොරොත්තු තැබීමට නැඹුරු වෙති. එහිදී උනන්දුවෙන් ධනය රැස් කිරීමට පෙළඹීමක් ද ඇති කරවයි. නමුත් භෞතිකමය ඉලක්කය කරා ළඟා වූ පසු, තාවකාලික තෘප්තියක් හැර, අපේක්ෂිත සතුට පිළිබඳ හැඟීම අපේක්ෂා කළ පරිදි සිදු නොවන බව පෙනේ.

එම නිසා සතුට යනු භෞතික තත්ත්වයන් වැඩිදියුණු කිරීමේ ප්‍රතිඵලයක් නොවේ.

ඇත්තෙන් ම සතුට යනු කුමක්ද? මතය අනුව, සතුට යනු අස්ථිර හැඟීමක් පමණි. මෙම අස්ථායී හැඟීම යම් දුරකට භෞතික තත්ත්වයන් සමඟ සම්බන්ධ වේ. නමුත් එය අපගේ මානසික තත්ත්වයට මෙන්ම සතුට අවබෝධ කර ගැනීමට මාර්ගය වන අපගේ අවශ්‍යතා ඇගයීමට ලක් කරන ආකාරය සමඟ වඩාත් සමීපව සම්බන්ධ වේ.

අපට ජීවිතය පිළිබඳ නිවැරැදි ආකල්පයක් නොමැති නම් හෝ, වෙහෙස නොබලා ද්‍රව්‍යමය දේ පසුපස හඹා යන්නේ නම් හෝ, සතුට සදාකාලිකව ම මිරිඟුවක් වනු ඇත. එම නිසා, සතුට රඳා පවතින්නේ භෞතිකමය අවශ්‍යතා සපුරාලීම මත පමණක් නොව එය හදවත හා සම්බන්ධ වීමක් ද සිදු විය යුතු ය.

මනුෂ්‍ය ජීවිතයේ සතුට අවබෝධ කර ගැනීමට නම් අප පළමුව දුක සහ ප්‍රීතිය අතර ඇති සම්බන්ධය නිවැරැදිව වටහා ගත යුතු ය.

බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් ජීවිතය දුක්ඛිත ය. අපි අතර සිටින බොහෝ දෙනෙක් මෙය සැබැවින්ම තේරුම් නොගෙන පසුව බුදු දහම නිෂේධාත්මක හා අශුභවාදී යැයි නිගමනය කළ හැකි ය. මන්ද අපගේ ජීවිතය සම්පූර්ණයෙන් ම දුක් විඳීම නොව, අර්ධ සතුටක් හෝ අර්ධ දුකක් වගේම අර්ධ වශයෙන් ප්‍රීතිමත් ය. එසේ නම් බුදුන් වහන්සේ එවැනි ප්‍රකාශයක් කළේ ඇයි?

ඇත්ත වශයෙන්ම, බුදුදහම මිනිස් හැඟීම් දුක්ඛ, සුඛ, ශෝකය, ප්‍රීතිය සහ සමබර බව ලෙස වර්ග පහකට බෙදා ඇත. දුක සහ සතුට භෞතික මට්ටමින් ප්‍රකාශ වන අතර, වේදනාව සහ ප්‍රීතිය ආධ්‍යාත්මික මට්ටමින් ප්‍රකාශ වේ. අපගේ හේතූන් අපට පවසන්නේ මෙම හැඟීම් පහ එදිනෙදා ජීවිතයේ කොටසක් වන අතර එම නිසා ඒවා නොවැළැක්විය හැකි බවයි.

කෙසේ වෙතත්, අපි අපගේ හදවතේ ගැඹුරින් හිතලා බැලුවාම දුකට වඩා සතුටට අකැමැති වන්නේ කවුද? ඇත්ත වශයෙන්ම, සතුට සෙවීම සියලු සංවේදී ජීවීන්ගේ සහජ බුද්ධියේම කොටසක්. අපි වසර දහස් ගණනක් තිස්සේ මනුෂ්‍ය ජීවිතය දුක් විඳීමෙන් මිදී සතුට ලබා ගැනීමට උත්සාහ කළෙමු. නමුත් ප්‍රතිඵලය කුමක්ද?

පුරාණයේ මිනිසුන්ට සිතාගත නොහැකි සැප පහසු භෞතික ජීවිතයක් අපට ලැබී ඇත. නමුත් අපි අපගේ දුක් වේදනා තුරන් කර තිබේද?

බුදු දහම පෙන්වා දෙන්නේ අපේ මේ ජීවිතය දුක්වලින් පිරුණු එකක් බවයි. එය සංසිද්ධි අනුව විස්තර කිරීමක් නොව, එය සංසිද්ධිවල සාරය මත පදනම්ව අප විසින් ඉදිරිපත් කරන ලද විනිශ්චයකි.

එනම් දුක් විඳීම මනුෂ්‍ය ජීවිතයේ ස්වභාවය වන අතර, ප්‍රීතිය දුක් විඳීමෙන් වෙන් කර තාවකාලික සහනයක් ගෙන දේ. යථාර්ථය නම්, අත්‍යවශ්‍ය ස්වභාවයක් ඇති කිසිදු ප්‍රීතිමත් දෙයක් කිසි විටෙකත් නැත. අත්‍යවශ්‍ය ස්වභාවය යන්නෙන් මම අදහස් කරන්නේ අප එවැනි ප්‍රීතියක් අත්විඳින්නේ කවදාද සහ කොපමණ කාලයකට වුව ද, ඕනෑම තත්ත්වයක් තුළ අපට සැම විටම එවැනි ප්‍රීතිය දැනිය යුතු ය. සැබෑ ජීවිතයේ එවැනි නිරපේක්ෂ සහ වෙනස් නොවන සතුටක් අපට සොයාගත හැකිද?

ඇත්ත වශයෙන්ම, අපි ජීවිතයේ විඳින ඕනෑම ආකාරයක සතුටක් මේ ජීවිතයේ යම් යම් දුක් වේදනාවලට සාපේක්ෂයි. නිදසුනක් වශයෙන්, අපට කුසගින්න දැනෙන විට, ආහාර ගැනීමෙන් අපි ප්‍රීතිමත් වන්නෙමු, අපට අපගේ පවුලෙන් වෙන් වූ විට දුකක් දැනුණ ද, නැවත එක් වූ පසු අපට සතුටක් දැනේ. අපි නින්ද නොයාමෙන් සිටින විට, අපට ප්‍රමාණවත් නින්දක් ලැබෙන්නේ නම් අපට සතුටක් දැනේ. කෙසේ වෙතත්, අපට බඩගින්නක් ඇති නොවන්නේ නම්, හෝ නින්ද නොයෑමක් ඇති නොවන්නේ නම්, අපි තවදුරටත් ආහාර ගැනීමෙන් හෝ නින්දෙන් සෑහීමකට පත්වේවි ද? වෙනත් වචනවලින් කිවහොත්, අපට අනවශ්‍ය ලෙස කෑමට හෝ නිදා ගැනීමට බල කළහොත් එය ද තවත් දුක් විඳීමේ උල්පතක් විය හැකි නොවේ ද? කුසගින්නෙන් හෝ නිදිමතෙන් පෙළෙන විට පමණක් ඒ වේදනාව සමනය වූ විට අපට සතුටක් දැනිය හැකි ය.

මෙම දෘෂ්ටිකෝණයෙන් බලන කල, අප සතුට ලබා ගන්නා ප්‍රමාණය, අප නිදහස් වන වේදනාවේ ප්‍රමාණයට සමානුපාතික වේ.

නූතන සමාජය ද්‍රව්‍යමය වශයෙන් විශාල දියුණුවක් ලබා ඇති අතර, පුරාණ කාලයේ සිටි අයට වඩා දුක් වේදනාවලින් මිදීමට මිනිසුන්ට බොහෝ ක්‍රම තිබේ.

ඉස්සර මිනිස්සු වෙන් වෙලා සිටින විට නැවතත් එකිනෙකා මුණගැසෙන එක අමාරුයි. කාලය ගෙවී යත්ම එකිනෙකා මුණගැසීමේ ආශාව ද වැඩි වේ. ඒ නිසාම කාලයකට පසු නැවත එක්වීමේ සතුට ඇති වූවාට සැකයක් නැත.

එකල වෙන් වීම අතිශයින් ප්‍රබල දුක් ගෙන දෙන කරුණක් විය. පැරැණි කාව්‍ය හා පද්‍යවලින් ද එවැනි විස්තර රාශියක් අපට සොයාගත හැකි ය. අද වන විට අපිට කෙනෙක්ව මඟ හැරුණොත්, ඔහු හෝ ඇය කොතරම් දුරක හිටියත්, අපිට ඒ වෙලාවෙම ඇමතුමක් ගන්න පුළුවන්, එහෙමත් නැත්නම් අන්තර්ජාලය හරහා එකිනෙකා මුණගැසීමේ ක්‍රමවේදත් නිර්මාණය වී තිබේ. එසේ නොමැති නම්, ගුවන් යානයකින් එම පුද්ගලයා බලන්න යන්නත් පුළුවන්.

දුර යනු තවදුරටත් සාගරයෙන් එහා තිබෙන දෙයක් වුව ද ජයගත නොහැකි බාධකයක් නොවේ. එසේ වුවද, පහසුකම් බහුල වන බැවින්, ආශාව නිසා ඇති වන දුක් වේදනා පැරැණි කාලයට වඩා තීව්‍ර වී ඇත. ඒ අනුව නැවත එක්වීමෙන් ඇති වන සතුටේ ද යම් අඩුවක් තිබේ.

ජීවිතයේ සත්‍යය නොවැටහෙන නිසා අපි දුක් විඳින්නෙමු. නමුත් මිනිසුන් බොහෝ විට මෙය නොදකින අතර, ලෝකය වෙනස් කිරීම දුක්ඛිත තත්ත්වයන් දුරු කිරීමට එළදායී මාර්ගයක් බව සිතත්. මෙම පක්ෂග්‍රාහී දැක්ම නිසාවෙන් නිරන්තරයෙන්ම අපගේ භෞතික තත්ත්වයන් වැඩිදියුණු කර ගන්නා අතරම අපටම දුක් වේදනා ද ඇති කර ගනී.

යම්තාක් දුරකට, අප විසින් ප්‍රශ්න ඇති කර ගන්නා වේගය, ලෝකය දියුණු කිරීමට අප කරන ප්‍රගතියට වඩා බොහෝ වේගවත් ය. නූතන සමාජයේ මිනිසුන් ඉහළ මට්ටමේ ශිෂ්ටාචාරයක් භුක්ති විඳින නමුත්, ඔවුන් වෙහෙසකර ජීවිතයක් ගත කරන අතර, ඔවුහු ඔවුන්ගේ මුතුන් මිත්තන්ට වඩා වැඩි පීඩනයක් අත්විඳිති. මෙයට හේතුව ඕනෑවට වඩා ආශාවන් හා දුක් වේදනා මිස අන් කිසිවක් නොවේ. ජීවිතයේ දුක් වේදනාවලට මූලික හේතුව මෙයයි. අපගේ හදවතින් හානිකර ආශාවන් සහ දුක් වේදනා තුරන් කිරීමෙන් පමණක් අවසානයේ අපට දුක්ඛිත මූලය ඉවත් කර විමුක්තිය ලැබිය හැකි ය.

වෙනත් ආගම් සාමාන්‍යයෙන් සතුට ස්වර්ගයේ සහ බාහිර ගැලවීමක තබයි. ඇත්තටම අපේ පරිසරය වෙනස් කිරීම උදාසීන පියවරක් එය හරියට "බෙහෙත් වෙනස් නොකර තැම්බුම් හොද්ද වෙනස් කරනවා වගේ" ජීවන තත්ත්වය වෙනස් නොවුණොත් ලැබෙන සතුට කෙටිකාලීනයි. අපේ හිතේ ව්‍යාකූලත්වය තවදුරටත් පවතින නිසා එය දිගටම පවතිනු ඇත. අවසන කරදර උපදවාගෙන නැවත ඉපදීම හෙවත් සංසාර චක්‍රය ද දීර්ඝ කර ගනී. සද්ධර්මය අපට උගන්වන්නේ ජීවිතයේ සත්‍යය අත්විඳිමින් සත්‍යාපනය කළ විට පමණක් අපගේ මෝහය ඥානාලෝකය බවට පත් කර දුකෙන් එතෙර විය හැකි බවයි.

තවද, අනෙකුත් ආගම්වලින් බුද්ධාගම වෙන් කර හඳුනාගත හැකි අත්‍යවශ්‍ය ලක්ෂණය වන ආත්ම විශ්වාසය විශේෂයෙන් අවධාරණය කරයි. වෙනත් ආගම් තුළ බාහිර බලය අවධාරණය කර ඇති අතර, ඇදහිලිවන්තයන් විශ්වාස කරන්නේ මිනිසුන්ට නිරපේක්ෂ විශ්වාසයක් තිබේ නම් ගැලවිය හැකි බවයි. බුද්ධාගම පිළිපැදීමේ දී, ප්‍රධාන වශයෙන් අපි, අප මතම රඳා සිටිමු, නමුත් අපි සමහර විට බුදුවරුන්ගෙන් සහ බෝධිසත්ත්වයන්ගෙන් ආශීර්වාද ලබා ගනිමු.

ඇත්ත වශයෙන්ම තමා මත පමණක් රඳා සිටිය නොහැක. අවබෝධයට පත්වීමට ප්‍රඥාව හා එයට අවශ්‍ය වන ක්‍රමවේද තිබිය යුතු ය. එනම්, අපි ආත්ම සහ ධර්මය යන දෙකම මත රඳා සිටිය යුතු බවයි. නොඑසේ නම් ආත්ම අභිමානයෙන් අපව නොමඟට ගෙන යනු ඇත. බුද්ධාගමේ අපි සරණය ලෙස හඳුන්වන බුදුන්, සද්ධර්මය සහ සංඝරත්නය "ත්‍රිවිධ රත්නය" ලෙස හැඳින්වේ. අපගේ ජීවිතය දියුණු කර ගැනීමට අප ඉගෙන ගන්නා අපගේ ආදර්ශය බුදුන් වහන්සේ ය. සද්ධර්මය යනු ජීවිතයේ සත්‍ය අවබෝධ කරන මාර්ගයයි. සද්ධර්මය ප්‍රගුණ කිරීමට අපට උපදෙස් දෙන අපගේ ගුරුවරුන් වන්නේ සංඝයා වහන්සේ ය. "ත්‍රිවිධ රත්නය" සරණ යාමෙන් අපට සැබෑ ලෙසම පරම විමුක්තිය ළඟා කර ගැනීමටත්, දුකින් මිදී සුගතියට පත්වීමටත් පුළුවන.



**දුර යනු තවදුරටත් සාගරයෙන් එහා තිබෙන දෙයක් වුව ද ජයගත නොහැකි බාධකයක් නොවේ. එසේ වුවද, පහසුකම් බහුල වන බැවින්, ආශාව නිසා ඇති වන දුක් වේදනා පැරැණි කාලයට වඩා තීව්‍ර වී ඇත. ඒ අනුව නැවත එක්වීමෙන් ඇති වන සතුටේ ද යම් අඩුවක් තිබේ.**

*ජී චුන් (ji qun) නාහිමියන්ගේ*
*What is the happiness*
*ලිපියේ සිංහල පරිවර්තනය*


පරිවර්තක
කථිකාචාර්ය හා අංශාධිපති (චීන භාෂා)
ICBN Campus
**පූජ්‍ය සඳමඩුල්ලේ සුමනසාර හිමි**

# යුරෝපයේ විශාල බර්මින්හැම් බෞද්ධ විහාරස්ථානයේ නිර්මාතෘන් වහන්සේ

උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර වැඩම කරනු ලබන්නේ

**එක්සත් රාජධානියේ බර්මින්හැම් බෞද්ධ මහාවිහාරය, ලෙස්ටර් ධර්මාශෝක බෞද්ධ විහාරය, ස්ටොක් ඔන් ට්‍රෙන්ට් බෞද්ධ විහාරය යන විහාරත්‍රයාධිපති ජාත්‍යන්තර සහන පදනමේ සභාපති, මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහා බ්‍රිතාන්‍යයේ උප ප්‍රධාන සංඝනායක**

## ආචාර්ය විතාරන්දෙණියේ කස්සප ස්වාමීන්ද්‍රයන් වහන්සේ



> 1986 වර්ෂයේ සිට ලෝකය වටා සිදුකෙරෙන සමාජ සත්කාරයන් ඇගයීමට ලක්කළ බ්‍රිතාන්‍ය එළිසබෙත් මහරැජින විසින් ආචාර්ය විතාරන්දෙණියේ කස්සප නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ OBE ගෞරව නාමයෙන් ද සම්භාවනාවට පාත්‍ර කළහ

විදේශ ධර්මදූත සේවය සඳහා සිය ජීවිතය කැප කළ ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේ අතර, සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන සිටින ශ්‍රී ලාංකික ජනතාවගේ ඉමහත් ගෞරවයට පාත්‍ර මෙන්ම අන්තර්ජාතික කීර්තියට ද පත්ව සිටින එක්සත් රාජධානියේ බර්මින්හැම් බෞද්ධ මහාවිහාරය, ලෙස්ටර් ධර්මාශෝක බෞද්ධ විහාරය, ස්ටොක් ඔන් ට්‍රෙන්ට් බෞද්ධ විහාරය යන විහාරත්‍රයාධිපති ජාත්‍යන්තර සහන පදනමේ සභාපති, මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහා බ්‍රිතාන්‍යයේ උප ප්‍රධාන සංඝනායක ආචාර්ය විතාරන්දෙණියේ කස්සප ස්වාමීන්ද්‍රයන් වහන්සේ නිර්මල ථෙරවාදී බුදුදහම ලොව පුරා ප්‍රචලිත කිරීමට සුවිශේෂී ශාසනික කාර්ය භාරයක නියැළී සිටින මහතෙරුන් වහන්සේ නමක් වශයෙන් හැඳින්විය හැකි ය.

**යො හොති විසාරදොච -**
**බහුස්සුතො ධම්මධරොච හොති**
**ධම්මස්ස හොති අනුධම්මචාරි -**
**ස තාදිසො වුච්චති සංඝ සොභනො**

යමෙක් ව්‍යක්ත ද, විශාර ද, බහුශ්‍රැත ද ධර්මධර ද, ධර්මයට අනුකූලව හැසිරෙන්නේ වේ ද හෙතෙම සංඝ ශාසනය බබුළුවන්නෙක් වේ. යන බුදු වදන වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම පූජ්‍ය විතාරන්දෙණියේ කස්සප ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජීවන චරිතය හා ගැළපේ යැයි කීම අතිශයෝක්තියක් නොවේ. උන්වහන්සේ අතිශය දුර්ලභ ගති ලක්ෂණ රැසකින් සමන්විත සංඝ පීතෘන් වහන්සේ නමකි. නිවැරදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කරමින් සුපේශල ශික්ෂාකාමී අර්ථචර්යාවෙහි පිළිපන් ධර්මවිනධර ශ්‍රද්ධා සම්පන්න චිරරාත්‍රඥ ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් භික්ෂුත්වය ශෝභමාන කරන ගුණාංග රාශියකින් උන්වහන්සේගේ චරිතය සමන්විත වෙයි.

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගිරුවාපත්තුවේ විතාරන්දෙණිය නම් සොඳුරු ගම්පියසෙහි ජන්ම ලාභය ලබා සංසාරයේ පුරණ ලද පාරමිතා බලයත්, සැදැහැති මව්පියන්ගෙන් ලද ශාසනික උරුමයත් මත 1968 වර්ෂයේ මාර්තු 01 වැනි දින විතාරන්දෙණියේ කස්සප යන උත්තරීතර ශාසනික නාමයෙන් උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ පුණ්‍යවන්ත පැවිදි දිවියට පත්වීමට තරම් උන්වහන්සේ භාග්‍යවන්ත වූහ. පූජ්‍යපාද දෙවුන්දර වාචිස්සර නායක හිමිපාණන් වහන්සේ හා කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරාධිපති ගල්බොඩ ඤාණිස්සර නායක හිමිපාණන් වහන්සේ යන ප්‍රතිබලසම්පන්න ව්‍යක්ත විශාරද යතිවරු උන්වහන්සේගේ ආචාර්යවරුන් බවට පත්විය.

උතුම් පැවිදි බිමට පත්වීමෙන් අනතුරුව කොළඹ හුණුපිටිය ගංගාරාම පිරිවෙනේ වැඩ සිටි සාර්වභෞම වියත් ඇදුරු මඬුල්ලක් හමුවේ ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා




කැලණිය විශ්ව විද්‍යාලයෙන් උපාධිය දිනාගත් කස්සප ස්වාමීන්ද්‍රයන් වහන්සේ ශික්ෂාකාමී සඟ පරපුරක් සම්බුද්ධ ශාසනයට දායාද කිරීමේ උදාර අරමුණ පෙරදැරිව 1981 වර්ෂයේ දී ගංගාරාම පිරිවෙනේ ආචාර්යවරයකු වශයෙන් ගුරුසේවය ආරම්භ කළහ. එම කාල පරිච්ඡේදයේදී ම උන්වහන්සේ වෙත ලැබුණු ආරාධනාවකට අනුව 1983 වර්ෂයේ දී අප්‍රිකාවේ ටැන්සානියාවේ විහාරස්ථානයකට වැඩම කිරීමට ද සිදුවිය. සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස කැප වී සිටින ආචාර්ය විතාරන්දෙණියේ කස්සප හිමිපාණන් වහන්සේ අප්‍රිකාවට වැඩම කිරීමත් සමඟ විදේශ ධර්ම දූත සේවයෙහි නියැළුණ ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් වර්තමානය දක්වාම භික්ෂුවට උරුම වූ කටයුත්තක් ලෙස නිර්මල ථෙරවාදී බුදුදහම ලොව පුරා ප්‍රචලිත කිරීමේ චිරාගත සම්ප්‍රදාය අනුගමනය කරමින් වැඩ සිටිති. එවකට ටැන්සානියා ජනාධිපති ජූලියස් නියරේරේගේ පුතණුවන් වූ ඇන්ඩෘ නියරේරේ බුදු දහම හැදෑරීමට ප්‍රියකළ බැවින් ඇන්ඩෘ නියරේ ශ්‍රී ලංකාවට කැඳවාගෙනවිත් වසර 2ක් බුදුදහම ඉගැන්වීමට කටයුතු කළ උන්වහන්සේ අනතුරුව නැවතත් එංගලන්තය බලා වැඩම කරමින් ජාත්‍යන්තර ධර්මදූත කටයුතු සේම සමාජසේවා කටයුතු ද ආරම්භ කළහ. එකම විහාරස්ථානයක් පමණක් පැවැති එංගලන්තය තුළ සෑම නගරයකටම වැඩම කරමින් එංගලන්තය පුරාම බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීමට සංවිධානාත්මක වැඩ පිළිවෙළක් උන්වහන්සේ විසින් දියත් කර ඇත.

ලෙස්ටර් නගරයේ ධර්මාශෝක බෞද්ධ විහාරයත්, ස්ටොක් ඔන් ට්‍රෙන්ට් බෞද්ධ විහාරයත් ආරම්භ කළ විතාරන්දෙණියේ කස්සප ස්වාමීන්ද්‍රයන් වහන්සේ International buddhist relief organization සංවිධානය ද ආරම්භ කළහ. එම IBRO ජාත්‍යන්තර බෞද්ධ සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ද විශේෂ පිළිගැනීමට භාජනය වී ඇත. ශ්‍රී ලංකාවට අමතරව රටවල් රැසක ශාඛාවන් පිහිටුවා ඇති අතර එම සංවිධානය තුළින් ලොව වටා බෞද්ධ ආගම සහ සංස්කෘතිය ප්‍රචලිත කිරීමට කටයුතු කර ඇත. තවද 1992 වර්ෂයේ දී බර්මින්හැම් මහා විහාරය නමින් විහාරස්ථානයක් midland international buddhist association යටතේ ආරම්භ කර ඇත. තවද ආගමික කටයුත්තක් සඳහා ස්වාමීන් වහන්සේ නමක් සොයා ගැනීමට නොහැකිව පැවැති ඉතාලියේ මිලාන් නගරය තුළ ශ්‍රී ලංකාරාමය නමින් විහාරස්ථානයක් ආරම්භ කළ උන්වහන්සේ වර්තමානය වන විට සමස්ත ඉතාලිය පුරාම බෞද්ධ විහාරස්ථාන ඉදිකිරීමට කටයුතු කර ඇත. විතාරන්දෙණියේ කස්සප නාහිමිපාණන් වහන්සේ 1988 වර්ෂයේ දී සෝවියට් ඇන්ග්ලෝ මිත්‍ර සංගමය සයිබීරියාවේ දී ආරම්භ කර ඇති අතර midiands buddhist communit association නමින් බෞද්ධ හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා සංගමයක් ද ආරම්භ කළහ.

තවද, ජිනීවා මානව හිමිකම් කොමිසම විසින් ශ්‍රී ලංකාවට විරුද්ධව යෝජනා ඉදිරිපත් කළ අවස්ථාවේ දී මහ බ්‍රිතාන්‍ය සංඝ සභාවේ උප සභාපති සහ ජාත්‍යන්තර බෞද්ධ සහන සංවිධානයේ සභාපති ස්වාමීන්ද්‍රයන් වහන්සේ වශයෙන් 46 වැනි ජිනීවා සැසිවාරය අමතමින් මාතෘ භූමිය වෙනුවෙන් කළ හැකි තම යුතුකම මැනවින් ඉටු කළහ.

1986 වර්ෂයේ සිට ලෝකය වටා සිදුකෙරෙන සමාජ සත්කාරයන් ඇගයීමට ලක්කළ බ්‍රිතාන්‍ය හිටපු එළිසබෙත් මහරැජින විසින් ආචාර්ය විතාරන්දෙණියේ කස්සප නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ 2008 වර්ෂයේ දී OBE ගෞරව නාමයෙන් ද සම්භාවනාවට පාත්‍ර කළහ. එපමණක් නොව සියලුම රටවල අධ්‍යාත්මික සුබසාධනය වෙනුවෙන් සිදුකළ විදේශ මෙහෙවර අගයමින් ශ්‍රී ලංකාවේ රුහුණු විශ්ව විද්‍යාල Senate ශාඛාව සහ Supreme Sangha Souncil මඟින් 2003 වර්ෂයේ දී ගෞරව ආචාර්ය උපාධියක් පිරිනැමීමට ද කටයුතු කර ඇත. මේ වන විට එක්සත් රාජධානියේ බර්මින්හැම්හි ඉදිවෙමින් පවතින යුරෝපයේ විශාලතම ශ්‍රී ලාංකේය බෞද්ධ විහාරස්ථානය වන බර්මින්හැම් බෞද්ධ විහාරස්ථානයේ නිර්මාතෘවරයාණන් වහන්සේ වන්නේ ද ආචාර්ය විතාරන්දෙණියේ කස්සප නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේම ය.

ලාභාපේක්ෂාවෙන් තොරව ආගමික, සමාජීය කටයුතුවලට දීර්ඝ සේවාවක් සිදුකෙරෙන, එමෙන්ම විදෙස් රටවලට වැඩම කරමින් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ප්‍රචාරණ කටයුතු සිදුකරන ආචාර්ය විතාරන්දෙණියේ කස්සප නාහිමිපාණන් වහන්සේට තුණුරුවන් සතු අනන්ත සුවිසි ගුණ බලයෙන් චිරාත් කාලයක් ශ්‍රී ලංකාවටත්, ලෝකවාසී සැමටත් ශාසනික සේවාවන් ඉටුකිරීමට ශක්තිය ධෛර්යය හා චිර ජීවනය ලැබේවා'යි ප්‍රාර්ථනා කරමි.

හේමමාලා රන්දුනු



# නැණවතා සිල්වතෙකි

**සිල්වත්බව සාමාන්‍යයෙන් හික්මුණු මිනිසාගේ ස්වභාවයයි. ඒ හික්මීම ද උප්පත්තියෙන් ඇතිවන හික්මීම, පරිසරය අනුව ඇතිවන හික්මීම යන්නෙන් දෙවැදෑරුම් වේ. සහජයෙන් හික්මීම ඇතිවන්නේ පෙර පින් ඇති සත්පුරුෂයන් තුළ ය. වැඩි දෙනෙක් හික්මෙන්නේ පරිසරය අනුවයි.**

සහජයෙන් හික්මීම නොලැබූ ඇතැම් පුද්ගලයෝ ගුණවතුන්, නැණවතුන් ඇසුරෙන් ද, යහපත් අධ්‍යාපනයෙන් ද හික්මෙති. පරිසරය යනු ඒ සත්පුරුෂ ඇසුර හා අධ්‍යාපනයයි.

මේ කොයි ක්‍රමයකින් වුව ද හික්මුණු තැනැත්තා සමාජයේ අහිංසකයෙකි. විනීතයෙකි. "සිල්වතා" යනු ද ඔහු ම ය. හික්මීම සිල්වතාගේ ලක්ෂණය හෙයිනි.

උප්පත්තියෙන් ම නොහික්මුණු පුද්ගලයෝ ද සමාජයේ අල්ප වෙති. වැඩි දෙනෙක් පරිසරය අනුව නොහික්මුණු පුද්ගලයෝ වෙති. කරුණු වටහා ගැනීමට නොහැකි නිසා ද, පරිසරයේ වරද නිසා ද බොහෝ පුද්ගලයන් නොහික්මුණු අය ලෙසින් ක්‍රියා කරතත් ඔවුන් අතුරෙන් වැඩි දෙනෙක් පරිසරයෙන් හික්මවිය හැකි බව ද පෙනේ. උප්පත්තියෙන් ම හික්මුණු ඇතැම් පුද්ගලයෝ නොහික්මුණු පුද්ගලයන්ට කරුණු වටහාදීමෙන් හික්මවා ගනිති.

කෙලෙසින් හෝ නොහික්මුණු මිනිසා සමාජ ද්‍රෝහියෙකි. සතුරෙකි. සමාජය කෙලෙසන්නෙකි.

"දුස්සීලයා" යැයි කියනු ලබන්නේ හික්මීමක් නැති තැනැත්තා ය. "දුස්සීලකම" නොහික්මුණු මිනිසාගේ ස්වභාවයයි. හික්මීමක් ඇති තැනැත්තා ම සමාජයේ සිල්වතා හෝ ගුණවතා වශයෙන් සැලකිය යුතුව තිබේ. එහෙයින් නියම මිනිසා නම් හික්මීමක් ඇති තැනැත්තා ම ය. හික්මීමක් ලබන්නේ සීලයෙන් ම ය.

අතීතයේ සමාජය තුළ පැවැති ඉවසීම, සමානාත්මතාව, කරුණාව, අන්‍යෝන්‍ය සහයෝගය, පොදු පරිහරණය, අහිංසක දිවි පෙවෙත ආදී ගති ගුණ පිරිස වැඩි වනවිට හීන වන්නට පටන්ගත් බව පෙනේ. එකිනෙකා කෙරෙහි ඊර්ෂ්‍යාව, කෝපය, අනෙකාට වඩා උසස් වීමේ ආශාව අනෙකාගේ දිවි පෙවෙතට කරදර වන ලෙසින් හැසිරීම, පෞද්ගලික පරිහරණයට ආශා කිරීම ආදී දුර්ගුණ (දුසිල්කම්) පුරුදු වන්නට වූ බව ද සැලකිය හැකි ය.

එහෙයින් ම දේපළ බෙදා ගැනීම, අනුන්ට අයත් දේ සොරා ගැනීම හෝ බලෙන් (පැහැර) ගැනීම, පරුෂ වචනය, මුසාවාදය, කේළම ආදී නරක ගතිපැවතුම් ද දියුණු වන්නට විය. කල් යත්ම නුවණැති සත්පුරුෂ මනුෂ්‍යයෝ මෙකී දුසිරිත්වලින් සුසිරිත් වෙන් කොට ගෙන මේ "පින්" ය. මේ "පව්" ය. මේ ධර්මය. මේ අධර්මයයි. මේ දුසිල්වත්කම් ය. මේ සිල්වත්කම් ය ආදී වශයෙන් පවත්වා ගත්හ.

මෙලෙසින් ඔවුනොවුන් අතර සමගිය හා සමාදානය පවත්වා ගැනීම සඳහා නානාවිධ 'දාන' විධි ද, කය - වචන දෙකේ සංවර භාවය පිණිස "සීල" විධි ද, චිත්ත දමනය සඳහා නානා විධියේ "භාවනා" ක්‍රම ද නියම කර ගත්හ.

එපමණක් ද නොවේ. ඔවුහු පර පණ නැසීම, අන් සතු දේ පැහැර ගැනීම ආදී පංච දුශ්චරිතය මිනිස් සමාජය කෙලෙසන විසම වූ දුසිල්කම් වශයෙන් ද, පංච දුශ්චරිතයෙන් වැළකීම "මනුෂ්‍ය ධර්මයක්" වශයෙන් ද නියම කර ගත්හ.

එසේම පංච දුශ්චරිතයෙහි යෙදෙන්නවුන් දුසිලුන් ලෙස ද, ඉන් වැළකී සිටින්නවුන් සිල්වතුන් ලෙස ද සම්මත කර ගත්හ. මෙසේ ආදි කල්පිතයන් අතර පංචශීලය ප්‍රථමයෙන් ම ඇති වූ බව සැලකිය හැකි ය.

මානව සමාජය දියුණුවත්ම ඇතැම් නුවණැතියන් මෛථුන්දම් සෙවීම පිළිකුල් කළහ. එය ග්‍රාම්‍ය ධර්මයක්. නීච වෘත්තියක් ලෙසින් සැලකූහ. එහි ප්‍රතිඵල වූයේ "බ්‍රහ්මචාරියක පංචශීලය" පනවා ගැනීමයි.

මෙයින් ද නොනැවතුණු ඇතැම් නුවණැතියන් සිත් සතන් තුළ හටගන්නා ලෝභා දී අකුසල් මැඩලීම සඳහා විකාල භෝජනය නොකළ යුතු යැයි සිතූහ. ඉර අවර වූ තැන් පටන් පසු දා අරුණෝදය තෙක් විකාල යැයි සලකා ඒ කාල සීමාව තුළ පාන වර්ගයක් පමණක් ගැනීමෙන් ඇතැමෙක් තෘප්තියට පැමිණියහ. "ඒක භක්තික ෂට්ක සීලය" සමාදන් වූහ.

ඇතැම් කෙනෙක් ක්‍රමයෙන් උස සුන් - මහ අසුන්වලින් ද නෘත්‍ය දර්ශන හා ගීත ශ්‍රවණයෙන් ද වැළකී අෂ්ටාංග ශීලයක් පනවාගත්හ.

ඒ ද නිත්‍යයෙන් රකින්නට අසමත් වූ පිරිස මසකට එක් දිනක් හෝ දෙදිනක් හැකි අය එයටත් වැඩි දින ගණනක් තුළ අටසිල් සමාදන් වූහ. එයටත් වඩා නුවණැත්තෙක් "දසසිල්" පනවාගත්හ. ඉතා සත්පුරුෂ වූ අයෙක් පොහෝ දිනයන් හි අෂ්ටාග ශීලය ද තවත් සිකපදයක් එකතු කිරීමෙන් "නවාංගපෝසථ ශීලය" ද සම්පූර්ණ කළහ.

මෙසේ ශීල ප්‍රතිපත්ති පනවාගත් නැණැතියෝ ඉන් නොනැවතී චිත්ත දමනය සඳහා නානාවිධ සමථ භාවනා ක්‍රම ඇති කරගෙන ඒ භාවනා බලයෙන් ධ්‍යාන සමාපත්ති හා අභිඥා ද ඉපදවූහ. අපේ ගෞතම සම්බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන කල පූර්වෝක්ත සියලු ශීල ප්‍රතිපත්ති ද සමථ භාවනා ක්‍රම ද පැවැත්තේ ය.

කාල දේවල, ආලාර කාලාම, උද්දකරාම පුත්‍ර ආදී තාපසයෝ මනා ශීල ප්‍රතිපත්තිවල පිහිටා නෛෂ්ක්‍රම්‍ය සංකල්පනා, අව්‍යාපාද සංකල්පනා, අවිහිංසා සංකල්පනා දියුණු කොට සමථ භාවනා බලයෙන් චිත්තවශීභාවය ගත්හු රූපාවචර වූ ද, අරූපාවචර වූ ද සමාපත්ති උපදවා විසූහ.

තථාගතයන් වහන්සේ ලොව පහළ වන විට පන්සිල්, අටසිල්, දසසිල් ආදී වශයෙන් දැක් වූ පූර්වෝක්ත සීල - භාවනා පින්කම් මහජනයා අතර ප්‍රචලිතව තිබුණි. එහෙත් සීලය පිළිබඳ ලක්ෂණ හෝ ආනිසංස හෝ නිසි ලෙසින් නොදත්හ. එහෙයින්ම පංචතාප තපන, මරුප්පතාප තපන, උදකාරෝහණායුක්ත ආදී ශීල විධි ද සමාදන් ව ගෙන අත්තකිලමථානුයෝගයන්හි ද යෙදුණාහ.

තථාගතයන් වහන්සේ අංග සම්පූර්ණ කොට මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටා රකින ශීලයෙහි ශ්‍රේෂ්ඨකම වදාළ සේක. නිර්වාණය ප්‍රාර්ථනා කොට ගෙන ඒ සඳහා පිරිය යුතු ගුණධර්ම හා සීල භාවනා ක්‍රම පිළිබඳ විවරණ ද කොට සීලය පාරමිතාවක් වන අයුරු ද සසර දුක් නැසීම පිණිස සම්පූර්ණ කළ යුතු ප්‍රතිපදාවෙහි ශීලය මුල් වන අයුරු ද සවිස්තරව වදාළ සේක.

බුද්ධාගමේ පරමාර්ථය නිර්වාණ ධාතුවයි. බෞද්ධයාගේ බලාපොරොත්තුව විය යුත්තේ ද නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කිරීමයි. එය සීලයෙන් තොරව අවබෝධ කළ හැක්කක් නොවේ. වර්ෂයකට වරක් දානයක් පිරිනැමූ පමණින්, දන්සලක් පැවැත් වූ පමණකින් බෞද්ධ පරමාර්ථය වන නිවන අවබෝධ කළ හැකි නොවේ.

පංච දුශ්චරිතයන් හි ගැලෙමින්, අධර්ම ජීවනෝපායන්හි යෙදෙමින්, මඩවළක ගැලීසිට ස්නානය කරන්නා සේ ඉඳහිට කරන දාන පරිත්‍යාගයකින් ම ආත්ම ශුද්ධියක් සිදු නොවේ. ඒ එසේ වේ නම් සීල භාවනා ප්‍රතිපත්ති පිරීමෙන් වැඩක් නැත.

කාලාන්තරයක් තිස්සේ ක්‍රමානුකූල සංවිධානයක් ඇතිව ආත්ම දමනයෙන් හා කාය වාග් සංවරයෙන් යුක්තව සීල, සමාධි, ප්‍රඥා ශික්ෂාපදය අනුව කටයුතු කරන්නාටයි නිවන් ලැබිය හැක්කේ.

සම්බුදුරදුන් හමුවෙහි දී මාර්ගඵලාවබෝධය කළ සියලු දෙනාම සීලයෙන් සමන්විත වූවෝ ය. මිනීමරු අංගුලිමාලයෝ ද ගම් පැහැරීම් මංකොල්ල කෑම් ආදී නානාප්‍රකාර දූෂණ ක්‍රියාවල යෙදී සිටි දහස් ගණන් දෙනා ද සරණ සීලයෙහි පිහිටා අනතුරුව ලොවුතුරු සැපය හිමි කර ගත්හ.

සරණ සීලයෙහි පිහිටා පිරිසුදුව රකින පංච ශීලය පවා නිවන් ලැබීමේ මූලික පතිපත්තිය වන්නේ ය.

අබුද්ධෝත්පාද කාලයේ විසූ නැණැතියන් විසින් නිත්‍ය ශීලය වශයෙන් පංච ශීලය පනවාගෙන එය ආරක්ෂා කරන්නට පටන් ගත් අයුරු ප්‍රථමයෙන් දැක්වීමු. තථාගතයන් වහන්සේගේ පහළවීමෙන් පසු ද නිත්‍ය බෞද්ධ ශීලය වශයෙන් ඇතැමෙක් පංච ශීලය ආරක්ෂා කළහ. සරණ සීලයෙහි පිහිටා අනතුරුව පංච ශීලය සමාදන් වූහ. එහෙත් සම්බුද්ධ ශාසනයේ නිත්‍ය ශීලය වන්නේ "ආජීව අට්ඨමක සීලය යි". සිද්ධාර්ථ ගෞතම මහ බෝසතාණන් වහන්සේ විසින් පැවිදි වූ දා පටන් ආරක්ෂා කරන ලද්දේ ශ්‍රේෂ්ඨතම වූ "ආජීව අට්ඨමක" සීලයයි.

ඇතැමෙක් "උපෝසථ අට්ඨාංග සීලය" පොහෝ දිනයන්හි ආරක්ෂා කළහ. විශාඛා උපාසිකාව, අනේපිඬු මහ සිටු ආදීහු නිත්‍ය වශයෙන් ආජීව අට්ඨමක සීලය ද පොහෝ දිනයන් හි අට්ඨාංග සීලය ද ආරක්ෂා කළහ.

"ඒවං උප වුත්ථෝ විසාඛේ පේ කිව මහප්ඵලෝ හෝති කීව මහානිසංසෝ" ආදී වශයෙන් විසාඛ පෝසථ සූත්‍රයෙහි දැක්වෙන පරිදි යම්කිසි කෙනෙක් අංග මගධ කාසිකෝසලාදී වශයෙන් වූ සොළොස් මහා ජනපදයන්ගේ සියලු වස්තු සම්පත් සහිත වූ ආධිපත්‍ය දරන්නේ නම්, එක දවසක රැක්කා වූ උපෝසථ අට්ඨාංග සීලයේ වටිනාකමින් සොළොස්වන කලාව තරම්වත් පූර්වෝක්ත රාජ්‍යාධිපත්‍යය නො වටනේ ය.

එපමණක් නොව "ඉර සඳ දෙදෙනාගේ ආලෝකය ලැබෙන එක් සක්වළක් තුළ ඇති සියලු රත්න ජාති යමකුට ලැබෙන්නේ නම් ඒ ලාභයට වඩා එක දවසක් රැක්කා වූ අට්ඨාංග උපෝසථ සීලයෙහි අනුසස් වැඩි බව ද දේශනා කර ඇත්තේ ය. සීලයෙහි ශ්‍රේෂ්ඨ බව එයින් පෙනේ.

අවුරුදු සියයක් දුශ්ශීලව ගත කරන ජීවිතයට වඩා එක දවසක් රැකි සිල්වත් ජීවිතය උතුම් වේ.

නැණවතා සිල්වතෙකි. සිල්වතා නැණවතෙකි. සීලය ඇති තැන ඥානය ඇත. ඥානය ඇති තැන සීලය ඇත. සීලයෙන් නුවණ දියුණු වේ. නුවණින් සීලය දියුණු වේ. සීල ප්‍රඥා දෙක ලෝකයේ අග්‍ර ධර්ම වෙති.

අයන්ති විතාන

# ජීවිතය පුරා ගලන පුණ්‍ය ගංගාව



**බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙරත් පින් කිරීම පිළිබඳ යම් යම් කතාබහ ලෝකයේ පැවතුණා.**

බුද්ධ ශාසනයෙන් බැහැරව අන්‍ය ආගම් තුළත් පින කියන වචනයට සමාන වචන භාවිත කරමින් යහපත් දේ ගැන කතා කරනවා. නමුත් බුද්ධ ශාසනයේ පමණයි පරිපූර්ණව පින ගැන කතා කරන්නේ. එනිසා පින කියන්නේ මොකක් ද? පිනෙන් වෙන යහපත මොකක් ද? පින් කර ගන්නා ආකාර මොනවා ද? කියා අපි හොඳින් දැන අවබෝධයෙන් සිටින්නට ඕනෑ.

## පින් කරන්න දුප්පත්කම බාධාවක් නොවෙයි

වර්තමානයේ මිනිසුන් තුළ තිබෙන මිථ්‍යා මතයක් තමා මුදල් තියෙන්නම ඕනේ පින් කරන්න කියලා. එය වැරැදි මතයක්. එවිට කෙනකුට හිතෙන්න පුළුවන් මුදල් නැතිව පින් කරන්න බැරිද කියා.

බුද්ධ ශාසනය තුළ පින් කරන්න මුදල් තිබෙන කෙනාටත් මුදල් නැති කෙනාටත්, පුළුවන්. මුදල් තිබෙන පුද්ගලයාත් මුදල් නැති පුද්ගලයාත් නුවණ පාවිච්චි කළොත් ඉතා උසස් ආකාරයෙන් පින් රැස්කර ගැනීමට අවස්ථාව තිබෙනවා.

යහපත කරන්න, පින් දහම් කරන්න මැලිකමක් දක්වන පිරිස කියන වචනයක් තමා අපට මුදල් තිබුණා නම් අපි පින් කරනවා. නමුත් අපට එසේ වියදම් කරන්න මුදල් නැහැනේ කියා. කෙතරම් මුදල් ලැබුණත් දන්දීමට කැමැත්ත ඇතැම් දෙනා තුළ නැහැ. පුංචි කාලයේ සිට පුරුද්දක් තිබෙන අය හෝ, ධර්මය අසා තිබෙන අය හැරෙන්නට අනෙක් අය පින් රැස්කර ගැනීම ගැන කතාබහ කරන්නේ හෝ ඒ පිළිබඳ ක්‍රියා කරන්නේ අඩුවෙන්.

## පින් රැස්කරන හැටි

පින කියා කියූ ගමන් බොහෝ අයට සිහිපත් වන්නේ දානය යි. එහෙත් පින කියන්නේ දානය පමණක් නොවේ. දස පුණ්‍ය ක්‍රියා යනුවෙන් පින් රැස් කර ගන්නා ක්‍රම දහයක් දේශනාවේ හමුවෙනවා. දන්දීම, සිල් රැකීම, භාවනාව, පින්දීම, පින් අනුමෝදන්වීම, අන්අයට උපස්ථාන කිරීම, අන් අයට ගෞරව කිරීම, සම්මා දිට්ඨිය පිරිසුදු කර ගැනීම ආදී පින් රැස්කර ගන්නා ක්‍රම යි.

එසේ ක්‍රම තිබෙද්දී අපි දානය පමණක් ඉස්මතු කර ගත යුතු නැහැ. දානය මෙන්ම තවත් පින් රැස් කර ගත හැකි ක්‍රම තිබෙනවා කියන දැනුම අප තුළ තිබෙන්න ඕනේ.

ඒ වගේම පින් කරන්න මුල්වන කරුණු තුනක් තිබෙනවා. ඒ දන් දීම, සිල් රැකීම, භාවනාව යි. දානයක් දෙනවිට ඇතැම් කෙනකුට හිතෙන්න පුළුවන් දානයට මුදල් වියදම් වෙනවානේ කියලා. එහෙත් සිල් රැකීම, භාවනා කිරීම, පින් දීම, පින් අනුමෝදන් වීම, අන්අයට උපස්ථාන කිරීම ආදියට මුදල් වියදම් වන්නේ නැහැ.

## ක්‍රියාවකින් තොරව රැස්වෙන පින්

යම් ක්‍රියාවක් නො කර පින් කරගත හැකි ක්‍රමයකුත් බුදු සසුනේ තිබෙනවා. ඒ සතුන් නො මරා සිටීම. එතැන දානයකුත් දෙනවා. මොකක්ද දෙන දානය. සතුනට අභය දානය දීමයි. ලෝකයට භය නැතිබව දන් දෙනවා.

අපට අභය දානය කිව්වාම මතක් වෙන්නේ මරන්න ඉන්න සතෙක් නිදහස් කිරීම පමණ යි. එයත් අභය දානයක් තමයි. එහෙත් ඒක විතරක් නොවේ අභය දානය. සතුන් නො මරා සිටීමත් දානයක්. එයට කිසිම මුදලක්, කිසිම මහන්සියක් නැහැ. එයට අවශ්‍ය සිහිය, නුවණ, වීර්ය යි.

සතුන් මැරීමෙන් වැළකී සිටින පුද්ගලයාට පුණ්‍ය ගංගාවක් ජීවිතයට ගලාගෙන එනවා. ඒ වගේම පන්සිල් ආරක්ෂා කරන පුද්ගලයාගේ ජීවිතයට පුණ්‍ය ගංගාවල් පහක් ගලනවා. පින කියන්නේ සැපයට කියන නමක්. ඒ නිසාම භාග්‍යවතුන් වහන්සේ වදාළා මහණෙනි, පිනට බය වෙන්න එපා. පින කියන්නේ සැපයට කියන වචනයක් කියලා.

බුද්ධ කාලයේ වගේම අදත් තිබෙන මතයක් තමා පින් කළවිට සසර දිගු වෙනවා කියා.

එහෙත් බුදුරජාණන් වහන්සේ වදාළේ සසර දිගු වන්නේ පින් කිරීමෙන් ම නොවේ. අවිද්‍යාව හා තණ්හාව තුළින් කියා. පින් කිරීමේ දී දානයක් දෙනවා නම් එහිදී අත්හැරීම නමැති ගුණය පුරුදු වෙනවා. එය සසර දුකෙන් මිදෙන්න උපකාරී වෙනවා.

දන් දුන්නත්, නො දුන්නත් අවිද්‍යාව දුරු නො කරන තාක් සසරේ සැරි සරනවා.

## නරක අත්හරින්න හොඳ අල්ලාගන්න

දානය කියන්නේ හොඳ දෙයක්. දන් නො දීම කියන්නේ නරක දෙයක්. සිල්වත් බව කියන්නේ හොඳ දෙයක්. දුස්සීල කියන්නේ නරක දෙයක්. එනිසා නරක දේ අතහැරලා හොඳ කිරීම බුදුරජාණන් වහන්සේ වර්ණනා කළ දෙයක්. අපිට කෙලෙස් දුරු කරනතුරු සසරේ යන්න වෙනවා. ඒ ජීවිතය තුළ සැපවත්ව ඉන්න පුළුවන් පින තුළින්. එනිසා අපි බුද්ධ දේශනා තුළින් හොඳින් තේරුම් ගන්න ඕනෑ පින කියන්නේ සැපයට කියන නමක් කියලා. පින කියන්නේ සැප වඩන දෙයක්. ඒ වගේම පින දානමය වශයෙන් පමණක් නොවේ. තවත් බොහෝ ක්‍රම තුළින් රැස්කර ගන්නට පුළුවන්.

## පින් ගංගාවක්

බුදුරජාණන් වහන්සේ වදාළා උන්වහන්සේගේ ගුණ දැනගෙන සරණ යෑමෙනුත්, ධර්මය සඟ ගුණ දැනගෙන සරණ යෑමෙනුත් ජීවිතයට පින් ගංගාවක් ගලනවා කියා.

කෙනක් තුනුරුවන් ගැන මුලින් වැඩි පැහැදීමක් නො තිබී පසු කාලයේ කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් තිසරණය ගැන පැහැදීමක් උපදවා ගත් අය ඒ තිසරණය ගැන පැහැදීම ඇති වූ දවසේ සිට මොනතරම් පින් රැස්කර ගන්නව ද?

අප හිතන රටාව, කතා කරන වචනය, ක්‍රියා කරන ආකාරය පින් වැඩෙන ආකාරයට අපට කරන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ සරණ ගිය පුද්ගලයාගේ සිත රාගයෙන් ද්වේෂයෙන්, මෝහයෙන් යට වෙන්නේ නැහැ. ඒ වෙලාවට බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති ආදි භාවනා තුළ සිත සෘජු වෙනවා. අකුසල් පැත්තට යන්නේ නැහැ. එහෙම නම් සිත තුළ රාග, ද්වේශ, මෝහය ආදි අකුසල් නොමැති අවස්ථාවක යහපත් සිතිවිලි තුනුරුවන් ගැන ක්‍රියාත්මක වෙනවා. එවිට නිරාමිස ප්‍රීතිය තුළින් ඒකාන්ත පිනක් රැස් වෙනවා.

එනිසා පින් රැස්කර ගන්න නම් මුදල් ඕනේ කියන මිථ්‍යා මතය අප බැහැර කළ යුතුයි. කෙනෙක් කලින් පොහොසත් වෙන්න පුළුවන්. විවිධ හේතු නිසා පසුව දුගී වෙන්නත් පුළුවන්. තිබෙන කාලයේ දන් දී පසුව ඒ දානය නො දී සිටියොත් එය ඔහුගේ ජීවිතයට පාඩුවක්.

අනේපිඬු සිටුතුමා බුදුරජාණන් වහන්සේගේ අග්‍රදායකයා. ඔහු බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට දිනපතා දන් දුන් කෙනෙක්. එහෙත් ඔහු ණයට දුන් මුදල් නොදී සිටීමෙන් සහ සඟවා තිබූ ධනය ස්වභාවික විපතින් විනාශ වී යාම නිසා දුප්පත් වුණා. එහෙත් ඔහු දන් වැට නතර කළේ නැහැ. එයට හේතුව බුදුරජාණන් වහන්සේ දානය ගැන වදාළ විස්තරය අනේපිඬු සිටුතුමා දැනගෙන සිටියා. දානයේ පින රැස්වෙන්නේ එහි දීම තුළින් ම නොවේ. පින රැස්වෙන්නේ සකසා දුන්නොත්, ගෞරවයෙන් දුන්නොත්, ඉවත නො දමන දෙයක් දුන්නොත් සහ සිත පහදවාගෙන දුන්නොත් පමණ යි.

එනිසා දන් දෙන්නට කලින් හා දීමට පසු සිත පහදවා ගැනීම තුළින් අග්‍ර පින් රැස්වෙනවා.

> දිනක් එක් දෙවියෙක් කියනවා දුප්පත් කෙනෙක්, දුප්පත්ව දෙන දානය පොහොසත් කෙනෙක් දෙන දානයට වඩා දහස් ගුණයකින් වටින බව. එය බුදුරජාණන් වහන්සේ අනුමත කළා

## ටිකක් ඇති කාලයේත් දන් දෙන්න

බුදුරජාණන් වහන්සේ වදාළේ ගොඩක් තිබෙන විටත්, ටිකක් තිබෙන විටත් දන් දෙන්න කියා.

දිනක් එක් දෙවියෙක් කියනවා දුප්පත් කෙනෙක් දුප්පත්ව දෙන දානය පොහොසත් කෙනෙක් දෙන දානයට වඩා දහස් ගුණයකින් වටින බව. එය බුදුරජාණන් වහන්සේ අනුමත කළා. එයට හේතුව කෝටිපතියකුට ලක්ෂයක් දෙනවා කියන එක සුළු කරුණක්. නමුත් කුලියක් කර සුළු මුදලක් උපයන මනුස්සයෙක් තමන් උපයන ඒ මුදලින් කොටසක් දානයට දුන්නොත් ඔහු අර කෝටිපතියාට දෙන දානයට වඩා මහා දානයක් දුන් කෙනෙක් වෙනවා.

ඒ නිසා සිල් රැකීමෙන් පුණ්‍ය ගංගාවක් ගලනවා. තෙරුවන් සරණ යාමෙන්, ධර්මය ශ්‍රවණය කිරීමෙන්, සෑයට, බෝධියකට වන්දනා කිරීමෙන් ජීවිතයකට පිනක් රැස් වෙනවා.

එනිසා පින් කරන්න සල්ලි ඕනේ කියන මිථ්‍යා කතාව අපි දුරින්ම දුරු කර නුවණ මෙහෙයවා කටයුතු කළොත් ඕනෑම අවස්ථාවක පින් රැස්කර ගන්නට පුළුවන්.

නයනා නිල්මිණී